# මුදල් කොමිෂන් සභාව

**අතිගරු ජනාධිපතිතුමා වෙත කෙරෙන නිර්දේශ - 2015**

**(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) වගන්තියට අනුව)**

**2015 මාර්තු**

දුරකථන:
**தொலைபேசி**
Telephone:

සභාපති
**தலைவர்**
Chairman: (+94) 011 2556840

ලේකම්
**செயலாளர்**:
Secretary: (+94) 011 2556831

කාර්යාලය
**காரியாலயம**
Office: (+94) 011 2556834
011 3071324

ෆැක්ස්:
**தொ.நகல்**
Fax (+94) 011 2556836
011 2556837

විද්‍යුත් තැපැල
**மின்னஞ்சல்**:
e-mail fincom@sltnet.lk


# මුදල් කොමිෂන් සභාව

**( ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154'ජ' ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)**

# நிதி ஆணைக்குழு

**(அரசியலமைப்பின் 154`எ ஆம்உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)**

# FINANCE COMMISSION

**(Established under Article 154 R of the Constitution)**


48, වජිර පාර,
කොළඹ 04.

**48,வஜிரா வீதி,**
**கொழும்பு**-04,**இலங்கை**.

48,Vajira Road,
Colombo 04, Sri Lanka.


මගේ අංක
**எனது இல**:
My No FC/3/1/2015

ඔබේ අංක
**உமது இல**:
Your No

දිනය
**திகதி**:
Date 2015.03.31

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,

ජනාධිපති ලේකම් කාර්යාලය,

කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය තුළ දැක්වෙන විධිවිධාන පරිදි 2015 වර්ෂය සඳහා නිර්දේශය මේ සමඟ ඉදිරිපත් කරමි. රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා යෝජිත උපායමාර්ග හා පළාත්වල උපයෝජනය සඳහා වාර්ෂික අයවැයෙන් වෙන් කරන ලද අරමුදල් බෙදා හැරිය යුතු ආකාරය ද මෙයට අන්තර්ගත වේ.

මෙම නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) වගන්තියට අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු අතර, ඒ නිර්දේශ මත ගනු ලැබූ ක්‍රියා කවරේදැයි පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වන්නේය.

මෙයට,

විශ්වාසී,

ආරියරත්න හේවගේ
සභාපති
මුදල් කොමිෂන් සභාව

## පටුන


1. මුදල් කොමිෂන් සභාවේ කාර්යය හා වගකීම ......... 1

1.1 බලය බෙදීමේ නීතිමය ප්‍රතිපාදන ......... 1

1.1.1 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනය ......... 1

1.1.2 1987 අංක 42 දරන පළාත් සභා පනත ......... 2

1.1.3 පළාත් ප්‍රඥප්ති සහ මුදල් රෙගුලාසි ......... 2

1.1.4 පළාත් පාලන ආයතන සඳහා නීතිමය පදනම ......... 3

1.1.5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහඅටවන සංශෝධනය ......... 3

2. පළාත් මූල්‍ය ප්‍රතිපාදන ......... 4

3. පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම ......... 6

3.1 පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම ......... 7

3.2 පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම ......... 8

3.2.1 සම්පත් වෙන් කිරීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදය ......... 9

3.3 පළාත් පුනරාවර්තන අවශ්‍යතාවයන් තක්සේරු කිරීම ......... 13

3.4 පුනරාවර්තන අරමුදල් පළාත් අතර වෙන් කිරීම ......... 16

3.5 පළාත් පාලන ආයතනවල මූල්‍යනය ......... 17

3.6 පළාත්වල මුළු අයවැය තත්ත්වය ......... 19

3.7 පළාත් මුදල් ප්‍රකාශය ......... 21

4. පළාත් ආදායම් ......... 21

4.1 රජයේ ආදායම් මාරු කිරීම ......... 21

4.2 බලය පවරන ලද ආදායම් මූලාශ්‍රවලින් එකතු කරනු ලබන ආදායම් ......... 22

4.3 2015 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන ......... 24

4.3.1 රජයේ ආදායම් මාරු කිරීම ......... 24

4.3.2 බලය පවරන ලද මූලාශ්‍ර සඳහා ආදායම් ඉලක්ක ......... 25

4.4 පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමෙන් ආදායම් පදනම පුළුල් කිරීම ......... 26

4.4.1 පළාත් සභාවල ආදායම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වන නිර්දේශ ......... 27

4.4.2 පළාත් පාලන ආයතනවල ආදායම් ප්‍රවර්ධන ක්‍රමවේද ......... 28

5. උප ජාතික මට්ටමේ සංවර්ධන උපායමාර්ග ......... 28

5.1 ජාතික ප්‍රතිපත්ති හා අනුගත වීම ......... 29

5.2 ග්‍රාමීය ජීවනෝපාය වැඩිදියුණු කිරීම ......... 30

5.3 මාර්ග සම්බන්ධතා සංවර්ධනය ......... 30

5.4 අඩු ආදායම්ලාභී පවුල් සඳහා අවම සුභසාධනය තහවුරු කිරීම ......... 30

5.5 පසුගාමී ප්‍රදේශ සඳහා විශේෂ අවධානය ......... 31

5.6 දින සියයේ වැඩසටහන ......... 31

5.7 දින සියයේ විප්ලවය - ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශය ........ 32
5.8 ඵලදායී මෙහෙයුම් හා ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම ........ 32
5.9 පළාත්වල කාර්යමණ්ඩල අවශ්‍යතා තක්සේරුව ........ 33
5.10 බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම ........ 33
6. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් කරා ........ 33
6.1 පළාත් ආර්ථික හා සාමාජයීය විෂමතා ........ 36
6.2 ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා යෝජිත ක්‍රියාමාර්ග ........ 39
7. සමාප්තිය ........ 41

## වගු ලැයිස්තුව


වගුව 1: පළාත් විසින් කරනු ලබන ප්‍රාග්ධන අවශ්‍යතා ඉල්ලීම් (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන) - 2015 .......8

වගුව 2: මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා - 2015....................................8

වගුව 3: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීම සඳහා හඳුනාගත් දර්ශක හා ඒ සඳහා බර තැබීම.........10

වගුව 4: අරමුදල් වෙන් කිරීම සඳහා භාවිතයට ගනු ලැබූ සංයුක්ත දර්ශක - 2015........................................11

වගුව 5: ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම - 2015 ........................................................................12

වගුව 6: පුනරාවර්තන වියදම්වලට අදාල පළාත් ඉල්ලීම් - 2015 ..............................................................13

වගුව 7: අනෙකුත් පුනරාවර්තන වියදම්වලට අදාල පළාත් ඉල්ලීම් - 2015 ..................................................14

වගුව 8: පළාත් තත්‍ය කාර්යමණ්ඩල සඳහා තක්සේරු කරන ලද පුද්ගල පඩිනඩි - 2015............................15

වගුව 9: පළාත් සඳහා තක්සේරු කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් - 2015*...................................15

වගුව 10: සාමූහික ප්‍රදාන වෙන් කිරීම - 2015 ......................................................................................16

වගුව 11: 2015 වසරේ අයවැය තුළින් වැටුප් වැඩිවීම වෙනුවෙන් පළාත් කාර්ය මණ්ඩලය සඳහා ඇස්තමේන්තු කරන ලද අමතර ප්‍රතිපාදන.........................................................................17

වගුව 12: පළාත් පාලන ආයතනවල සේවක වැටුප් හා මහජන නියෝජිතයින්ගේ දීමනා සඳහා මුදල් වෙන් කිරීම - 2015 ...........................................................................................................18

වගුව 13: 2015 වසරේ අයවැය තුළින් වැටුප් වැඩිවීම වෙනුවෙන් පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා ඇස්තමේන්තු කරන ලද අමතර ප්‍රතිපාදන .........................................................18

වගුව 14: පළාත්වල මුළු අයවැය තත්ත්වය.............................................................................20

වගුව 15: රාජ්‍ය ආදායම මාරු කිරීම - 2013 සහ 2014...................................................................22

වගුව 16: බලය පවරන ලද මූලාශ්‍ර යටතේ එකතු කරන ලද පළාත් ආදායම් - 2013 ...............................23

වගුව 17: බලය පවරන ලද මූලාශ්‍ර යටතේ එකතු කරන ලද පළාත් ආදායම් (ජූනි දක්වා) - 2014* ................23

වගුව 18: පළාත්වලට මාරු කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද රජයේ ආදායම - 2015 ..........................24

වගුව 19: 2015 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන.........................................................................25

වගුව 20: 2015 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ ..........25

වගුව 21: පළාත් ආදායම් හා පළාත් පුනරාවර්තන වියදම් *..........................................................26

වගුව 22: සම්පත් මූලාශ්‍රය අනුව පළාත් මට්ටමෙන් ප්‍රතිපාදන වෙන් කිරීම - (2011-2015).........................35

වගුව 23: පළාත් අනුව මූලික සමාජ - ආර්ථික දත්ත.......................................................................37


## ඇමුණුම් ලැයිස්තුව


ඇමුණුම 1: සාමූහික ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2014 …………………….………..........…i

ඇමුණුම 2: උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2014……………….........…. ii

ඇමුණුම 3: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 –2014…..........…iii

# 1. මුදල් කොමිෂන් සභාවේ කාර්යය හා වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 13 වන සංශෝධනය යටතේ පළාත්වලට මුදල් වෙන් කිරීමේ කාර්යභාරය සඳහා සම්බන්ධීකාරකයෙකු හා පහසුකම් සපයන්නෙකු ලෙස මුදල් කොමිෂන් සභාව ස්ථාපනය කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය 13 වන සංශෝධනයේ 154 ජ (4) (5) හා (6) යන වගන්තිවල පහත අයුරින් දක්වා ඇත.

(i) පළාත් අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණ ඉටු කරලීමෙහිලා ප්‍රමාණවත් වන පරිදි, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය හා උපදෙස් මත පදනම්ව රජය විසින් වාර්ෂික අයවැයෙන් අරමුදල් සැපයිය යුතු වේ.

(ii) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

(අ) රජය මගින් වාර්ෂිකව පළාත් වෙත සපයනු ලබන අරමුදල් හා ඒවා පළාත් අතර බෙදා වෙන් කිරීමට අදාල වූ ප්‍රතිපත්ති.

(ආ) පළාත් මූල්‍යකරණය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලබන වෙනත් ඕනෑම කරුණක්.

(ඇ) රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සහතික කරලීමේ අරමුණ ඇතිව මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති සම්පාදනය සිදු කළ යුතු වේ. එහිදී, එක් එක් පළාතට අයත් ජනගහනය, එක් එක් පළාතේ ඒකපුද්ගල ආදායම, සමාජ-ආර්ථික විෂමතාවන් වඩාත් අවම කරලීමේ අවශ්‍යතාවය සහ පළාත් අතර ඒක පුද්ගල ආදායම සම්බන්ධයෙන් පවත්නා වෙනස වඩාත් අවම කරලීම යන කරුණු සැලකිල්ලට ගනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) වගන්තියේ දැක්වෙන පරිදි මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන සෑම නිර්දේශයක්ම ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු අතර, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වේ.

## 1.1 බලය බෙදීමේ නීතිමය ප්‍රතිපාදන

ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට බලය බෙදීමේ ක්‍රියාදාමය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදුන් විධිවිධාන හා පාර්ලිමේන්තුවෙන් අනුමත පනත් ඇතුළත් ව්‍යවස්ථාමය විධිවිධාන රාශියක් මත පදනම් වේ. එම ව්‍යවස්ථාමය හා නීතිමය රාමුව පිළිබඳ විස්තරය සංක්ෂිප්තව පහත දැක්වේ.

### 1.1.1 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනය

පළාත් සභා ක්‍රමය සමඟ බැඳුණු බලය බෙදා හැරීමේ රාජ්‍ය යාන්ත්‍රණය තුළ පළාත් සභාවලට ව්‍යවස්ථාදායක, විධායක හා මූල්‍ය අධිකාරිත්වය භුක්ති විඳීමේ අවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය තුළින් සැලසී තිබේ. දහතුන් වන සංශෝධනය මගින් ජාතික රජය හා පළාත් සභා අතර බලය බෙදා හැරීමට අදාල

වන ලැයිස්තු 03 ක් හඳුන්වාදී ඇත. එනම්, සංචෘත ලැයිස්තුව (රජය සතු බලතල), පළාත් ලැයිස්තුව (පළාත්වලට පවරන ලද බලය) හා සමගාමී ලැයිස්තුව (වගකීම හවුලේ බෙදාගත් ක්ෂේත්‍ර) යනුවෙනි. මෙම සංශෝධනයත් සමඟ රට තුළ රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන ලෙස ස්ථර තුනකින් යුත් රාජ්‍ය පාලන තන්ත්‍රයක් බිහිවිය.

දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා ක්‍රමයට අදාලව පහත දැක්වෙන අයුරින් ව්‍යවස්ථාමය පදනම සපයා ඇත.

(i) පළාත් සභා ස්ථාපිත කිරීම
(ii) පළාත් සඳහා ආණ්ඩුකාරවරුන් පත්කිරීම
(iii) පළාත් සභාවල සාමාජිකත්වය හා නිල කාලය
(iv) ප්‍රධාන අමාත්‍යවරයා හා අමාත්‍ය මණ්ඩලය පත්කිරීම හා ඔවුනට අයත් බලතල
(v) පළාත් සභාවල ව්‍යවස්ථාදායක බලය
(vi) පරිපාලන යාන්ත්‍රණයෙහි බිඳවැටීමක් සිදුවූ අවස්ථාවක ගතහැකි විකල්පමය ක්‍රියාමාර්ග
(vii) පළාත්බද මහාධිකරණ ස්ථාපිත කිරීම
(viii) මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීම

### 1.1.2 1987 අංක 42 දරන පළාත් සභා පනත

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, පළාත් සභා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, 1987 අංක 42 දරන පළාත් සභා පනත මගින් විස්තරාත්මකව දක්වා ඇත.

(i) පළාත් සභාවල සාමාජිකත්වය
(ii) පළාත් සභා රැස්වීම් හා කටයුතු සිදුකරගෙන යාම
(iii) පළාත් සභාවල මූල්‍ය පරිපාටිය
(iv) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ස්ථාපිත කිරීම
(v) ප්‍රධාන ලේකම් හා අනෙකුත් නිලධාරීන් පත්කිරීම

### 1.1.3 පළාත් ප්‍රඥප්ති සහ මුදල් රෙගුලාසි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනයට අනුව, පළාත්වලට අදාල ප්‍රඥප්ති සැකසීමේ බලය එම පළාත් සභාවලට පැවරී ඇත. සෑම පළාත් සභාවක්ම ස්වකීය ප්‍රඥප්තිවලට එකඟතාවය ලබාගැනීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ආණ්ඩුකාරවරයා විසින් මෙලෙස ඉදිරිපත් කරන ලද ප්‍රඥප්තිවලට එකඟතාවය ලබාදීම හෝ එසේ නොවන අවස්ථාවන්හිදී ඒවා යලි සලකා බැලීම සඳහා ආපසු අදාල පළාත් සභාව වෙත යොමු කිරීම හෝ සිදුකරනු ඇත.

පළාත් මුදල් රෙගුලාසි තුළ ද පළාත් සංවර්ධන සැලසුම් ක්‍රියාවලියේ දී මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ විධිවිධාන ඇතුළත් කර ඇත. පළාත් මුදල් රෙගුලාසිවල සඳහන් වන විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා මුදල් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන අයුරින් දායකත්වය සපයනු ඇත.

- පළාත් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සහ කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් වාර්ෂිකව තක්සේරු කිරීම.
- පළාත් අවශ්‍යතාවයන් තක්සේරු කිරීමට අදාල මාර්ගෝපදේශ හා උපදෙස් නිකුත් කිරීම.
- පළාත් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව පළාත් සංවර්ධනය සඳහා අවශ්‍ය කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදන නිර්දේශ කිරීම.
- රජය විසින් වෙන් කරන ලද වාර්ෂික ප්‍රදාන පිළිබඳව පළාත්වලට දැනුම් දීම.
- රාජ්‍ය ප්‍රතිපත්තිය හා අයවැය රාමුවට අනුගත වෙමින් රාජ්‍ය අරමුදල් උපයෝජනය ඇතුළත්ව වාර්ෂික සංවර්ධන සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- ඵලදායී ලෙස සම්පත් උපයෝජනය කිරීම මගින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සහතික කරලීම සඳහා පළාත් යොමු කිරීම.

### 1.1.4 පළාත් පාලන ආයතන සඳහා නීතිමය පදනම

පළාත් පාලන ආයතන, රාජ්‍ය යාන්ත්‍රණයේ තුන්වන ස්ථරය සේ සැලකෙන අතර, මහජනතාවට විවිධ වූ සේවාවන් සැපයීමේ වගකීම එම ආයතන විසින් උසුලනු ලබයි. එකී සේවාවන් තුළට මාර්ග හා කාණු පද්ධති, සනීපාරක්ෂක සේවා, නිවාස, පුස්තකාල, පොදු උද්‍යාන හා විනෝදාත්මක පහසුකම් අයත් වේ. සියලුම පළාත් පාලන ආයතන මහජන ඡන්දයෙන් තේරී පත්වූ සභිකයන්ගෙන් සමන්විත වේ.

පළාත් පාලන පද්ධතිය නීතිමය පදනමකින් යුත් ආයතන තුනක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙනි. වර්තමානයේ රට තුළ මහ නගර සභා 23 ක්, නගර සභා 41 ක් සහ ප්‍රාදේශීය සභා 271 ක් ක්‍රියාත්මක වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් පාලනය, පළාත් සභාවලට පවරන ලද විෂයයක් ලෙස හඳුනාගෙන ඇත. අදාල නීති රෙගුලාසි යටතේ ස්වකීය මූල්‍යමය අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස පළාත් පාලන අරමුදල් පිහිටුවා ගැනීම සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය බලතල පැවරී ඇත. ඒ අනුව, මහ නගර සභා අරමුදල, නගර සභා අරමුදල හා ප්‍රාදේශීය සභා අරමුදල යනුවෙන් අරමුදල් පිහිටුවා ගෙන තිබේ.

### 1.1.5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහඅටවන සංශෝධනය

2010 වර්ෂයේ දී, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වාදෙන ලද දහඅට වන සංශෝධනය තුළින් කොමිෂන් සභා හතක් පත්කිරීම සඳහා විධිවිධාන යොදා ඇත. සංශෝධනයේ 41 ඒ (1) වගන්තිය යටතේ දැක්වෙන 1 වන උපලේඛනයෙහි සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයින් ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබයි. මෙම පත්වීම් සිදුකිරීමේ දී, ජනාධිපතිතුමා විසින් එම වගන්තිය යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ලබාගත යුතුය. ඉහත දක්වන ලද කොමිෂන් සභා හතට මුදල් කොමිෂන් සභාව ද අයත් වේ.

කෙසේ වුවද, වත්මන් රජය විසින් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කර 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේ ක්‍රියාවලියේ නිරතව සිටී.

## 2. පළාත් මූල්‍ය ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි රජය විසින් මුදල් කොමිෂන් සභාව විමසා පළාත් අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රමාණවත් අයුරින් පළාත්වලට ප්‍රතිපාදන වෙන් කර දිය යුතු වේ. මුදල් කොමිෂන් සභාව විසින් රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති වන පරිදි ප්‍රතිපාදන නිර්දේශ කිරීම හා එම ප්‍රතිපාදන පළාත් අතර බෙදා හැරීම කළ යුතු වේ. මෙහිලා කොමිෂන් සභාවේ කාර්යභාරය ප්‍රධාන වශයෙන් දෙයාකාර වේ.

(අ) පළාත් විසින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය අවශ්‍යතා තක්සේරුව මත පදනම් වී අරමුදල් පිළිබඳව ඇස්තමේන්තුවකට එළඹීම සහ රජයේ ප්‍රතිපත්තිමය මහපෙන්වීම් හා ප්‍රමුඛතාවයනට අනුගතවීම සහතික කරලීම. මෙම අවශ්‍යතාවයනට සරිලන පරිදි ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් රජයට දැනුම් දෙනු ඇත.

(ආ) ප්‍රාදේශීය විෂමතා අවම වන අයුරින් මෙකී ප්‍රතිපාදන පළාත් අතර බෙදා වෙන් කිරීම.

මුදල් කොමිෂන් සභාව විසින් පළාත් අතර ප්‍රතිපාදන බෙදා වෙන් කිරීමේ දී පහත දැක්වෙන 'ප්‍රදාන' වර්ගයන් භාවිතයට ගනු ලැබේ.

**සාමූහික ප්‍රදාන:** 'සාමූහික ප්‍රදාන' ලෙස හැඳින්වෙන්නේ පළාත් තුළ අඛණ්ඩව සේවා සැපයීම සඳහා මෙන්ම, එම සේවා සැපයීම් වැඩිදියුණු කිරීම පිණිස පළාතට දෙනු ලබන පුනරාවර්තන වියදම් සඳහා වූ අරමුදල් ය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පළාත් කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන සඳහා ගෙවීම් සිදු කිරීම පුනරාවර්තන වියදම්වලින් අපේක්ෂිත ප්‍රධාන කාර්යය වේ. මෙම වැටුප් හා වේතන ගණනය කිරීමේ දී අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ සිටින තත්‍ය කාර්ය මණ්ඩලය සැලකිල්ලට ගනු ඇත. මෙම සාමූහික ප්‍රදාන තුළට පළාත් පාලන ආයතනවලට අයත් සේවකයින්ගේ වැටුප් හා වේතන සහ සභිකයින්ගේ දීමනා ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය වියදම් ද ඇතුළත් වේ. (2009-2014 කාලපරිච්ඡේදය තුළ සාමූහික ප්‍රදාන යටතේ නිර්දේශිත අරමුදල් ප්‍රමාණයන් හා ඒවා බෙදා හැර තිබෙන ආකාරය ඇමුණුම - I මගින් විස්තර කෙරේ.)

**උපමාන පාදක ප්‍රදාන:** රට තුළ දක්නට ලැබෙන ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන් අවම වන අයුරින් පළාත්බද ජනතාවගේ සමාජ - ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස, පළාතේ අභිමතය පරිදි සංවර්ධන කටයුතු සඳහා වැය කිරීම වෙනුවෙන් සපයනු ලබන ප්‍රාග්ධන දීමනා 'උපමාන පාදක ප්‍රදාන' ලෙස දැක්විය හැක. එසේ වුවද, මෙම අරමුදල් භාවිතයට ගැනීමේ දී, මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ සමග අනුගත වීම අවශ්‍ය කෙරේ. 2009-2014 කාලපරිච්ඡේදය තුළ සාමූහික ප්‍රදාන යටතේ නිර්දේශිත අරමුදල් ප්‍රමාණයන් සහා ඒවා බෙදා හැර තිබෙන ආකාරය ඇමුණුම - II මගින් පැහැදිලි කෙරේ.

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන:** මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් බලය පවරන ලද විෂයන් යටතට ගැනෙන අංශවලට අයත් ආර්ථික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධනයට විශේෂ අවධානයක් යොමු කරමින්, ප්‍රාග්ධන ස්වරූපයේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන ලබාදෙනු ඇත. මෙම අරමුදල් ආයෝජනය පිණිස වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වේ. සෑම පළාත් සභාවක්ම

මෙම ප්‍රතිපාදන යටතේ සකස් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය සඳහා ඉදිරිපත් කළ යුතු වේ. මුදල් කොමිෂන් සභාව එම සැලසුම් සඳහා එකඟත්වය ලබාදීමේ දී ඒවා ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පිළියෙල වී තිබේ ද, පළාතේ සැබෑ අවශ්‍යතාවයන් හා ප්‍රමුඛතාවයන් හඳුනාගෙන තිබේ ද යන කරුණු පිළිබඳ විමර්ශනයක් කරනු ඇත. මේ සඳහා පළාත් බලධාරීන් හා අදාල අනෙකුත් ආයතන සමග සාකච්ඡාවන් සිදු කරනු ලබන අතර, එම ආයෝජනයන්ගේ ප්‍රතිඵල මැන බැලීම සඳහා යෙදවුම්, නිමැවුම් සහ ඒවායේ බලපෑම් මැන බැලීමේ දර්ශකයන් ද හඳුනාගනු ලබයි. එම දර්ශකයන් පදනම් කරගෙන මෙහෙයවීම හා ප්‍රතිඵල ඇගැයීම ද කලින් කලට සිදු කරනු ඇත. මුදල් කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති ආකෘති පත්‍ර, සැලසුම් ඉදිරිපත් කිරීමේ දී හා මෙහෙයුම් හා ඇගැයුම්කරණයේ දී පළාත් සභා විසින් භාවිතා කළ යුතුය. 2009-2014 කාලපරිච්ඡේදය තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කරන ලද අරමුදල් හා ඒවා බෙදා වෙන් කිරීම් පිළිබඳ තොරතුරු ඇමුණුම - III මගින් විස්තර කර ඇත.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් අතර බෙදා හැරීම සිව් ආකාර වේ.

i. **ආංශයික වෙන් කිරීම්:** පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීමට අදාලව අංශ / විෂයන් 22 ක් කෙරෙහි මුදල් කොමිෂන් සභාව විසින් 2015 වසරේ දී අවධානය යොමු කරනු ඇත. මෙම විෂයන් සහ ව්‍යාපෘතීන්ට අදාල වැඩසටහන් පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අංශ, ඒකක, අධිකාරි හෝ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන හරහා ක්‍රියාත්මක කෙරේ. මේ ආයතන විසින් අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලබයි. එක් එක් ආයතනය සඳහා වෙන් කරනු ලබන අරමුදල පළාත් අයවැය මගින් ප්‍රකාශ කරනු ලබයි.

ii. **තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වූ විශේෂ ව්‍යාපෘති:** ප්‍රාදේශීය විෂමතාවයන් අවම කරලීමේ අරමුණින් පළාත් විසින් හඳුනාගන්නා ලද විශේෂ මධ්‍යකාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මේ යටතේ අරමුදල් වෙන් කෙරේ. වර්ෂ 1-3 ත් අතර කාල පරාසයක් තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ යුතු මෙම ව්‍යාපෘති සඳහා කොමිෂන් සභාවේ පූර්ව එකඟතාවය ලබාගැනීම අවශ්‍ය වේ. මෙම ව්‍යාපෘති මගින් එකතු කළ වටිනාකම වැඩිකිරීම, දිළිඳු බව දුරලීම හා රැකියා ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ධනාත්මක බලපෑමක් සිදුකිරීම අපේක්ෂා කෙරේ. තවද, මෙම ව්‍යාපෘති ප්‍රධාන අංශ නියෝජනය වන ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ සැකසීම සිදු කළ යුතු වේ.

iii. **පසුගාමී සහ හුදකලා ගම්මාන සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති:** අත්‍යවශ්‍ය මූලික යටිතල පහසුකම් නොමැතිව පසුගාමී හා හුදකලාභාවයට පත්ව ඇති ග්‍රාමීය ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ වැඩසටහන් / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස මේ යටතේ ප්‍රතිපාදන වෙන් කෙරේ. මෙවැනි ගම්මානවල සංවර්ධනය සඳහා දායක විය හැකි සියලුම අංශයනට අයත් ක්‍රියාකාරකම් සැලකිල්ලට ගැනෙන ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ මෙම වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කළ යුතු වේ. මේ යටතේ කුඩා පාලම්, බෝක්කු හා ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, විදුලි බලය හා පානීය ජලය සැපයීම, කෘෂිකාර්මික සංවර්ධනය, කුඩා කර්මාන්තවලට පහසුකම් සැලසීම සහ යෝග්‍ය තාක්ෂණය ප්‍රචලිත කිරීම වැනි ක්ෂේත්‍ර සඳහා අරමුදල් යෙදවීම අපේක්ෂා කෙරේ.

iv. **නම්‍යශීලී අරමුදල:** මූලික සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කිරීමට නොහැකි වූ අත්‍යවශ්‍ය සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස අවස්ථාවක් සපයනු වස් මෙම ප්‍රතිපාදන භාවිතා කළ හැකි වේ.

ඉහත සඳහන් ප්‍රතිපාදනවලට අමතරව ජාතික මට්ටමෙන් පළාත්වල ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කර දක්වා ඇත. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පළාත් කාර්ය මණ්ඩල සහාය ද ලබාගනු ඇත.

## 3. පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම

රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සහතික කරලීම සඳහා මූලධර්ම හා ප්‍රතිපත්ති පිළියෙල කිරීම සහ අරමුදල් නිර්දේශ කිරීම පිළිබඳ වගකීම දරන මූලික ආයතනය වශයෙන්, මුදල් කොමිෂන් සභාව විසින් පළාත් පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතාවයන් තක්සේරු කිරීමේ දී හා විශේල්ෂණය කිරීමේ දී පුළුල් ක්‍රියාවලියක් අනුගමනය කරනු ලබයි. මේ සඳහා විවිධ නිර්ණායක ඇතුළත් අයවැය මාර්ගෝපදේශ කොමිෂන් සභාව විසින් පළාත් සභාවලට නිකුත් කරනු ලබයි. මේ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් 2015 වර්ෂය වෙනුවෙන් ද පළාත් මූල්‍ය අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

ඉහත දක්වන ලද වගකීම ඉටු කිරීමට අදාල ක්‍රියාවලිය සංක්ෂිප්තව පහත දක්වා ඇත.

- අදාල පළාත් නිලධාරීන් සමග මූලික සාකච්ඡාවන් සිදු කරනු ලබන අතර, ඉහත මාර්ගෝපදේශ මගින් පෙන්නුම් කරන ලද පළාත් සංවර්ධන ප්‍රමුඛතා, අවශ්‍ය කරනු ලබන සේවා සැපයුම සහ තත්‍ය කාර්යමණ්ඩල ආදිය පිළිබඳව පුළුල් පරාසයක පවත්නා දත්ත හා තොරතුරු මෙහිදී අදාල කර ගනු ලැබේ.
- මෙම සාකච්ඡා මගින් පළාත් අරමුදල් අවශ්‍යතාවයන් පිළිබඳ තක්සේරුවකට එළඹෙන අතර, එකී තොරතුරු මුදල් කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබේ.
- මුදල් කොමිෂන් සභාව සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව මහා භාණ්ඩාගාරය විසින් පළාත්වලට වෙන් කළ යුතු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන සහ සාමූහික ප්‍රදානවලට අදාල අරමුදල් පිළිබඳ එකඟතාවයකට එළඹේ.
- මුළු අරමුදල් ප්‍රමාණය පිළිබඳව දැනුම් දීමෙන් පසු මුදල් කොමිෂන් සභාව විසින් අදාල නිර්ණායක භාවිතයට ගෙන එකී අරමුදල් පළාත් අතර බෙදා වෙන් කරලීම සිදු කෙරේ.
- එලෙස වෙන් කරනු ලබන ප්‍රතිපාදන අනුසාරයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා ලෙස ප්‍රධාන අමාත්‍යවරයා විසින් පළාත් අයවැය පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. අනතුරුව ආණ්ඩුකාරවරයා වෙත අයවැය ඉදිරිපත් කරනු ලබන අතර, ඔහු විසින් එය අනුමැතිය සඳහා පළාත් සභාවට යොමු කරනු ලබයි.
- ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදනවලට අනුව මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික අයවැයෙන් සපයන ලද අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීමට අදාල ප්‍රතිපත්ති ඇතුළත් නිර්දේශ ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රජයට පළාත් අවශ්‍යතාවයන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර මුදල් කොමිෂන් සභාව විසින් පළාත් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්වලට අදාල ඉල්ලීම් ඉතා සැලකිල්ලෙන් අධ්‍යයනය හා ඇගයීම කරනු ලබයි. මෙම අධ්‍යයනයේ දී පවත්නා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන, ජාතික ප්‍රතිපත්තීන් හා අනුගත වීම, පළාත් විසින් සකස් කර ඇති මධ්‍ය කාලීන සැලසුම්, මහා භාණ්ඩාගාරය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා පළාත් විසින් පසුගිය වර්ෂවල කරනු ලැබූ වියදම්වල ප්‍රගතිය ඇතුළත් කරුණු රාශියක් සැලකිල්ලට භාජනය කරනු ලබයි.

### 3.1 පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම

පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීමේ දී, මුදල් කොමිෂන් සභාව විසින් රජයේ ප්‍රතිපත්ති රාමුව හා පළාත්වල මධ්‍යකාලීන සැලසුම් සැලකිල්ලට ගෙන පරිපූර්ණ විශ්ලේෂණයක් සිදු කරනු ලබයි. මෙහිදී, එක් එක් පළාත තුළ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීම හා සේවාවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, සැලසුම් කරනු ලැබූ ප්‍රතිඵලයන් අත් කර ගැනීම, සම්පත් නාස්තිය හා ද්විකරණය වළක්වා ගැනීම, ප්‍රමුඛතා පෙළගැස්වීම, පළාත් සභා සහ ආයතනවල ධාරිතාවය ඉහළ නැංවීම සහ ජාතික ප්‍රතිපත්ති හා පළාත් මධ්‍යකාලීන සැලසුම් ආදිය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

මෙම ක්‍රියාදාමයේ දී, පළාත්වල ප්‍රමුඛ ප්‍රාග්ධන අවශ්‍යතා හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන පරිදි ක්‍රමානුකූල ක්‍රමවේදයක් මුදල් කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලබයි.

i. පළාත්වල ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කිරීමට අදාල ආකෘති පත්‍රය (Form II) අනුව කැඳවීම.
ii. එම ආකෘති පත්‍රවලට අනුව, පළාත් විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රාග්ධන අවශ්‍යතාවයන්, පළාත්වල කාර්ය සාධනය, පළාත් මධ්‍ය කාලීන සැලසුම්වලින් අපේක්ෂිත ප්‍රතිඵල, මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවලට ඇති අනුකූලතාවය, රජය විසින් හඳුනාගෙන ඇති සංවර්ධන ප්‍රමුඛතා, සේවා කාර්යක්ෂමතාවය පවත්වාගෙන යාම, ද්විකරණය වළක්වාලීම, වෙන් කර ඇති සම්පත් ප්‍රමාණය යනාදී උපමාන ඇසුරින් විශ්ලේෂණය කිරීම.
iii. ප්‍රාදේශීය අසමතුලිතතාවයන් අවම කිරීමේ අවශ්‍යතාවය, ආයෝජන ප්‍රමුඛතාවයන් සහ පවත්නා මූල්‍ය සම්පත් ප්‍රමාණය මත පදනම්ව පළාත් ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පිළිබඳව භාණ්ඩාගාරය සමග උපදේශාත්මක සාකච්ඡා පැවැත්වීම.
iv. එම සාකච්ඡා මත පදනම්ව පළාත් ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පිළිබඳව මහා භාණ්ඩාගාරයට නිර්දේශ ඉදිරිපත් කිරීම.
v. වෙන් කරනු ලබන ප්‍රාග්ධන අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම.

2015 වර්ෂය සඳහා පළාත් සභාවන් විසින් ඉල්ලුම් කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා වගු අංක 01 හි දැක්වේ.

වගුව 1: පළාත් විසින් කරනු ලබන ප්‍රාග්ධන අවශ්‍යතා ඉල්ලීම් (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන) - 2015

*(රු.මි.)*

| පළාත | පළාත් ඉල්ලීම් | පළාතට අයත් කොටසේ % |
|---|---|---|
| බස්නාහිර | 6,593 | 11 |
| මධ්‍යම | 5,595 | 09 |
| දකුණු | 14,353 | 24 |
| උතුරු | 6,977 | 12 |
| වයඹ | 6,843 | 11 |
| උතුරු මැද | 3,555 | 06 |
| ඌව | 7,496 | 12 |
| සබරගමුව | 2,432 | 04 |
| නැගෙනහිර | 6,519 | 11 |
| **එකතුව** | **60,363** | **100** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු - 2015*
*සටහන: දේශීය හා විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ ව්‍යාපෘතීන් හැර*

2015 වසර වෙනුවෙන් එක් එක් පළාතට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබූ ප්‍රතිපාදන, වගු අංක 02 හි දැක්වේ.

වගුව 2: මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා - 2015

*(රු.මි.)*

| පළාත | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | | උපමාන පාදක ප්‍රදාන | |
|---|---|---|---|---|
| | මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය | පළාතට අයත් කොටසේ % | මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය | පළාතට අයත් කොටසේ % |
| බස්නාහිර | 6,097 | 14.2 | 1,290 | 13.6 |
| මධ්‍යම | 5,397 | 12.6 | 1,165 | 12.3 |
| දකුණු | 5,120 | 11.9 | 1,161 | 12.2 |
| උතුරු | 3,978 | 9.3 | 935 | 9.8 |
| වයඹ | 4,537 | 10.6 | 967 | 10.2 |
| උතුරු මැද | 3,659 | 8.5 | 845 | 8.9 |
| ඌව | 4,523 | 10.5 | 1007 | 10.6 |
| සබරගමුව | 5,133 | 11.9 | 1,106 | 11.6 |
| නැගෙනහිර | 4,556 | 10.6 | 1024 | 10.8 |
| **එකතුව** | **43,000** | **100** | **9,500** | **100.0** |

*මූලාශ්‍රය: අයවැය අංශය, මුදල් කොමිෂන් සභාව*

### 3.2 පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම

රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති වන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා එයට අනුකූලවන පරිදි පළාත් අතර ප්‍රතිපාදන වෙන් කර දීම මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයකි. ප්‍රාග්ධන අරමුදල් පළාත් අතර වෙන් කිරීමේ කාර්යයයේ දී මුදල් කොමිෂන් සභාව විසින් එක් එක් පළාතේ ජනගහනය, එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම, පවත්නා සමාජ-ආර්ථික විෂමතාවයන් අවම කිරීම හා පළාත් අතර ඒක පුද්ගල ආදායමේ පවත්නා වෙනස්කම් අවම කිරීම යන කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත. මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රාග්ධන අරමුදල් (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන) පළාත් අතර බෙදා

හැරීම සඳහා සංඛ්‍යානමය සූත්‍රයක් භාවිතා කරනු ලබයි. මෙම සූත්‍රය තුළින් මුදල් කොමිෂන් සභාව පහත දැක්වෙන දර්ශක භාවිතා කරමින්, පළාත් අතර පවතින ආර්ථික හා සාමාජීය විෂමතාවයන් සමාජ-ආර්ථික දත්ත ඇසුරින් විශ්ලේෂණය කරනු ලබයි.

- දළ ජාතික නිෂ්පාදිතයට පළාතේ දායකත්වය
- පළාත තුළ ආර්ථික අංශවල දායකත්වයේ සාමාන්‍යය
- ජාතික මට්ටමින් ආර්ථික අංශ සඳහා පළාතේ දායකත්වයේ සාමාන්‍යය
- පළාත් වාර්ෂික වර්ධන අනුපාතය
- පළාතේ ජනගහනය හා ඒක පුද්ගල ආදායම
- පළාත් දරිද්‍රතා අනුපාතය
- පළාත්වලට අදාල අනෙකුත් සමාජ-ආර්ථික දර්ශක

පළාත් අතර ප්‍රතිපාදන වෙන් කිරීමේ දී, විදේශ ආධාර භාවිතා කරමින් පළාත් තුළ විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන ව්‍යාපෘති පිළිබඳව අවධානය යොමු කරමින්, දේශීය සම්පත් වෙන් කිරීම පිළිබඳව ගැලපීමක් සිදු කරනු ඇත.

### 3.2.1 සම්පත් වෙන් කිරීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදය

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ පළාත්වලට අරමුදල් වෙන් කිරීමේ දී කොමිෂන් සභාව විසින් සංඛ්‍යානමය සූත්‍රයක් (Formula) භාවිතයට ගනු ලැබේ.

සියලුම පළාත් සඳහා සංයුක්ත දර්ශකයක් (Composite Index) සැකසීමේ දී "මූලික සංරචක විශ්ලේෂණය" (Principal Components Analysis) නැමැති සංඛ්‍යානමය ක්‍රමවේදය යොදාගෙන තිබේ. මෙය බහු විචල්‍යමය සංඛ්‍යාන ක්‍රමවේදයක් වන බැවින්, මහජනතාවගේ ජීවන මට්ටම කෙරෙහි සෘජුවම බලපානු ලබන විචල්‍යයන් කිහිපයක් මේ සඳහා තෝරාගනු ලැබේ. මෙම සම්පත් වෙන් කිරීමේ සූත්‍රය (Resource Allocation Formula) සඳහා යොදාගත් විචල්‍යයන් පහත 03 වගුවේ දැක්වෙන කාණ්ඩ 04 ට අයත් වේ.

**වගුව 3: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීම සඳහා හඳුනාගත් දර්ශක හා ඒ සඳහා බර තැබීම**

| | උපමාන | දර්ශක | බර තැබීම |
|---|---|---|---|
| **01.** | **දරිද්‍රතාවය හා ආදායම** | | **40%** |
| | i. ජනගහනය | පළාතේ ජනගහන කොටස | 14% |
| | ii. ඒක පුද්ගල ආදායම | ඒක පුද්ගල ආදායමට පළාතේ දායකත්වය | 08% |
| | iii. දරිද්‍රතාවය | දරිද්‍රතා දර්ශකය | 08% |
| | iv. සේවා වියුක්තිය | පළාත් රැකියා වියුක්ත අනුපාතිකය | 10% |
| **02.** | **සෞඛ්‍ය සහ පෝෂණය** | | **15%** |
| | i. ළදරු මරණ | සජීවී උපත් 1000 කට | 7.5% |
| | ii. අඩු බර උපත් | සජීවී උපත් 100 කට | 7.5% |
| **03.** | **අධ්‍යාපනය** | | **15%** |
| | i. පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් වීම | පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් වීමේ අනුපාතය | 05% |
| | ii. ද්වීතියික මට්ටම දක්වා පාසල් අධ්‍යාපනය ලබාගැනීම | ද්වීතියික මට්ටම දක්වා අධ්‍යාපනය නිම කළ ජනගහන ප්‍රතිශතය | 05% |
| | iii. පාසල් හැරයාම (අවු. 06 සිට 14 දක්වා) | පාසල් හැරයාමේ අනුපාතය (අවු. 06 සිට 14 දක්වා) | 05% |
| **04.** | **යටිතල පහසුකම්** | | **30%** |
| | i. විදුලිය නොමැති නිවාස | විදුලිය නොමැති නිවාස ප්‍රතිශතය | 05% |
| | ii. පළාත් මාර්ග (‘සී’ හා ‘ඩී’) | පළාත් මාර්ග ප්‍රතිශතය | 25% |

*මූලාශ්‍රය: ප්‍රතිපත්ති, ප්‍රකාශන හා පර්යේෂණ අංශය, මුදල් කොමිෂන් සභාව*

ප්‍රතිපාදන බෙදා හැරීම සඳහා භාවිතා කළ සංඛ්‍යානමය සූත්‍රය පහත දැක්වෙන පරිදි වේ.

$$x_i = a_1 V_{1i} \bar{B} + a_2 V_{2i} \bar{B} + \ldots + a_n V_{ni} \bar{B}, \quad \sum_{i=1}^{n} a_i = 1$$

Xi = i පළාත සඳහා වෙන් කරන ලද අරමුදල්

Vni = i පළාත සඳහා වූ අරමුදල් විචල්‍ය කාණ්ඩයේ ලකුණු

an = Vn විචල්‍ය කාණ්ඩය සඳහා බර තැබීම

පළාත් අතර උපමාන පාදක අරමුදල් බෙදා හැරීම සඳහා පළාත් ජනගහනය, ඒක පුද්ගල ආදායම, දරිද්‍රතා අනුපාතය හා සේවා වියුක්ති අනුපාතය යන දර්ශක සලකා බලනු ඇත. එක් එක් දර්ශකය සඳහා බර තැබීම සිදු කර ඇත්තේ පහත පරිදිය.

| උපමාන | බර තැබීම |
|---|---|
| **ජනගහනය** | 35% |
| **ඒක පුද්ගල ආදායම** | 20% |
| **දරිද්‍රතා අනුපාතය** | 20% |
| **සේවා වියුක්ති අනුපාතය** | 25% |

පළාත් නිශ්චිත සංවර්ධන හා උපමාන පාදක ප්‍රදාන යටතේ පළාත් අතර අරමුදල් වෙන් කිරීම පිණිස භාවිතයට ගනු ලැබූ සංයුක්ත දර්ශක, වගුව - 04 මගින් දක්වා ඇත.

**වගුව 4: අරමුදල් වෙන් කිරීම සඳහා භාවිතයට ගනු ලැබූ සංයුක්ත දර්ශක - 2015**

| පළාත | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා සංයුක්ත දර්ශක ලකුණු | උපමාන පාදක ප්‍රදාන සඳහා සංයුක්ත දර්ශක ලකුණු |
|---|---|---|
| බස්නාහිර | 0.141776 | 0.215716 |
| දකුණු | 0.119078 | 0.120791 |
| සබරගමුව | 0.119396 | 0.105867 |
| මධ්‍යම | 0.125506 | 0.125938 |
| ඌව | 0.105193 | 0.083533 |
| නැගෙනහිර | 0.105971 | 0.091885 |
| වයඹ | 0.105490 | 0.110560 |
| උතුරු මැද | 0.085104 | 0.072859 |
| උතුරු | 0.092487 | 0.072850 |

*මූලාශ්‍රය: අයවැය අංශය, මුදල් කොමිෂන් සභාව*

මෙම සංයුක්ත දර්ශක භාවිතයට ගනිමින්, මහා භාණ්ඩාගාරය විසින් එකඟතාවය පළකරන ලද ප්‍රාග්ධන අරමුදල් පළාත් නිශ්චිත සංවර්ධන හා උපමාන පාදක ලෙසින් පළාත් අතර වෙන් කරන ලදී. කෙසේ වුවද, එක් එක් පළාත තුළ ජාතික මට්ටමෙන් විදේශධාර හා දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ පළාත් විසින් උපයනු ලබන ආදායම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඒ හා ගැලපෙන පරිදි කිසියම් සංශෝධන කරන ලදී.

මීළඟ පියවර ලෙස මුදල් කොමිෂන් සභාව සිදුකරනු ලැබුවේ පළාත තුළ පවතින විවිධ අංශ හා ආයතන සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන වෙන් කර දීමයි. එලෙස අංශ හා ආයතන අතර ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීමේදී, මුදල් කොමිෂන් සභාව විසින් තෝරා ගනු ලැබූ කරුණු කිහිපයක් මත පදනම් වූ අතර, ඒවා පහත පරිදිය.

(i) රජයේ ඉදිරි සංවර්ධන ප්‍රතිපත්තිමය මගපෙන්වීම් හා උපාය මාර්ග සමග අනුගත වීම.

(ii) පළාත් විසින් පිළියෙල කරන ලද මධ්‍ය කාලීන ආයතනික ප්‍රතිඵල රාමු තුළ හඳුනාගෙන තිබෙන අරමුණු හා ප්‍රමුඛ පරාසවලට අනුගත වීම.

(iii) සෞඛ්‍ය, අධ්‍යාපන හා සමාජ සේවා වැනි ප්‍රධාන සමාජ-ආර්ථික ක්ෂේත්‍රයන්හි පළාත තුළ දක්නට ලැබෙන විෂමතා.

(iv) ආදායම් උත්පාදන කාර්යයන් සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ශණය කරගත හැකිවන පරිදි පළාත්වල භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය.

(v) පළාත් ආර්ථිකයන් තුළ ඉදිරි හා පසු සම්බන්ධතා ඇති කරලීමට හැකි වන අයුරින් සැලසුම් කරන ලද විශේෂ ව්‍යාපෘති.

(vi) පළාතේ අනෙකුත් ප්‍රදේශ සමග සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් භූගෝලීය වශයෙන් හුදෙකලා වූ ප්‍රදේශවල ඍජු ප්‍රතිඵල ඇති කිරීමට සමත් තෝරාගත් ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම.

2015 වර්ෂය සඳහා පළාත් අතර බෙදා වෙන් කරන ලද ප්‍රාග්ධන අරමුදල් වගු අංක 05 හි දැක්වේ. මෙම වගුවෙහි දේශීය හා විදේශීය අරමුදල් උපයෝගී කරගෙන පළාත් මට්ටමෙන් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් ද ඇතුළත් කර ඇත.

**වගුව 5: ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම - 2015**

*(රු.මි.)*

| පළාත | උපමාන පාදක ප්‍රදාන | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | උප එකතුව | පළාතට අයත් කොටසේ % | සංවර්ධන ව්‍යාපෘති* | එකතුව | පළාතට අයත් කොටසේ % |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 525 | 1,452 | 1,977 | 12 | 1,145.91 | 3,122.91 | 09 |
| මධ්‍යම | 500 | 1,390 | 1,890 | 12 | 2,489.35 | 4,379.35 | 13 |
| දකුණු | 385 | 1,305 | 1,690 | 11 | 2,691.80 | 4,381.80 | 13 |
| උතුරු | 400 | 1,440 | 1,840 | 12 | 3,597.80 | 5,437.80 | 15 |
| වයඹ | 425 | 1,325 | 1,750 | 11 | 1,174.77 | 2,924.77 | 09 |
| උතුරු මැද | 375 | 1,190 | 1,565 | 10 | 1,040.10 | 2,605.10 | 08 |
| ඌව | 375 | 1,350 | 1,725 | 11 | 2,011.17 | 3,736.17 | 11 |
| සබරගමුව | 400 | 1,365 | 1,765 | 11 | 2,995.10 | 4,760.10 | 14 |
| නැගෙනහිර | 400 | 1,190 | 1,590 | 10 | 1,279.32 | 2,869.32 | 08 |
| **එකතුව** | **3,785** | **12,007** | **15,792** | **100** | **18,425.32** | **34,217.32** | **100** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*
**ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන දේශීය හා විදේශීය අරමුදල් යොදවන ලද ව්‍යාපෘති*

පළාතේ විවිධ අංශවලට වෙන් කර ඇති ප්‍රතිපාදන මත පදනම්ව පළාත් බලධාරීන් විසින් 2015 වර්ෂය සඳහා පළාත් වාර්ෂික සැලැස්ම පිළියෙල කරනු ලබයි. මෙහිලා අංශ 22 ක් හඳුනාගෙන ඇත. එයට අමතරව, තුලිත ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘති, හුදෙකලා හා පසුගාමී ගම්මාන සංවර්ධන ව්‍යාපෘති හා නම්‍යශීලී අරමුදල යටතේ ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ඉහත ව්‍යාපෘතීන් අනුමත කිරීමේ දී, මුදල් කොමිෂන් සභාව සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන නිර්ණායක පහත පරිදි වේ.

i. ජනතාවගේ ජීවන මට්ටම් ඉහළ දැමීම උදෙසා අත්‍යවශ්‍ය වන සෞඛ්‍ය, අධ්‍යාපන හා මාර්ග අංශයන්ගේ සංවර්ධන අවශ්‍යතාවයන්.

ii. විවිධ ආදායම් මට්ටම්වලට අයත් පුද්ගලයන්ගේ අවම සුභසාධනය සහතික කරලීම.

iii. පළාත් තුළ ආදායම් හා රැකියා අවස්ථාවන් උත්පාදනය කිරීමේ අරමුණින් එකතු කළ අගය සහිත කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිගැන්වීම.

iv. රජයේ ප්‍රතිපත්ති හා අනුගත වෙමින් පසුගාමී ප්‍රදේශවල පෞද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම.

v. රජයේ දින සියය වැඩසටහන හා අනුගත වීමේ අවශ්‍යතාවය.

vi. පළාත තුළ තිබෙන දිස්ත්‍රික්ක අතර සාධාරණ ලෙස සම්පත් බෙදීයාම සහතික කරලීම.

vii. ගුණාත්මක සේවාවක් ලබාදීම සහතික කරලීම සඳහා ගොඩනැගිලි හා අනෙකුත් ව්‍යුහයන්ගේ අවශ්‍යතාවය හඳුනාගැනීමේ වැදගත්කම.

### 3.3 පළාත් පුනරාවර්තන අවශ්‍යතාවයන් තක්සේරු කිරීම

පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් පුද්ගල පඩිනඩි හා අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. කාර්ය මණ්ඩල සඳහා ගෙවනු ලබන පුද්ගල පඩිනඩිවලට වැටුප් හා වේතන, අතිකාල දීමනා, නිවාඩු දින ගෙවීම් හා අනෙකුත් දීමනා අයත් වේ. අනෙකුත් පුනරාවර්තන වියදම්වලට ගමන් වියදම්, සැපයුම්, නඩත්තු වියදම්, ගිවිසුම්ගත සේවා, අනෙකුත් ආයතනවලට කරනු ලබන ප්‍රදානයන්, සහනාධාර හා පොළී ගෙවීම් ආදිය ඇතුළත් වේ. සාමූහික ප්‍රදාන අනුමත කිරීමේ දී, මුදල් කොමිෂන් සභාව විසින් අපේක්ෂිත ආදායම සැලකිල්ලට ගනු ලැබේ. ඊට අමතරව, පළාත් සභා විසින් පළාත් පාලන ආයතනවලට කරනු ලබන ප්‍රදානයන් පළාතේ වියදම් අයිතමයන් ලෙස සලකනු ඇත. 2015 වර්ෂය සඳහා වූ පළාත් පුනරාවර්තන අවශ්‍යතා ඉල්ලුම් වගුව 06 හි දැක්වේ.

**වගුව 6: පුනරාවර්තන වියදම්වලට අදාල පළාත් ඉල්ලීම් - 2015**

**(පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ ඇතුළත්ව)**

*(රු.'000)*

| පළාත | පුද්ගල පඩි නඩි | පළාතට අයත් කොටසේ % | වෙනත් පුනරාවර්තන වියදම් | පළාතට අයත් කොටසේ % | මුළු පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| බස්නාහිර | 26,434,100 | 60 | 17,847,963 | 40 | **44,282,063** |
| මධ්‍යම | 18,355,153 | 73 | 6,865,349 | 27 | **25,220,502** |
| දකුණු | 16,506,341 | 76 | 5,318,971 | 24 | **21,825,312** |
| උතුරු | 11,061,291 | 74 | 3,898,237 | 26 | **14,959,528** |
| වයඹ | 17,014,169 | 76 | 5,425,687 | 24 | **22,439,856** |
| උතුරු මැද | 9,702,270 | 73 | 3,536,284 | 27 | **13,238,554** |
| ඌව | 11,379,055 | 74 | 4,092,345 | 26 | **15,471,400** |
| සබරගමුව | 16,886,030 | 78 | 4,660,046 | 22 | **21,546,076** |
| නැගෙනහිර | 12,256,425 | 73 | 4,589,084 | 27 | **16,845,509** |
| **එකතුව** | **139,594,834** | **71** | **56,233,966** | **29** | **195,828,800** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු - 2015*

වගුව 7: අනෙකුත් පුනරාවර්තන වියදම්වලට අදාල පළාත් ඉල්ලීම් - 2015

(පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ හැර)

(රු.'000)

| පළාත | වෙනත් පුනරාවර්තන වියදම් |
|---|---|
| බස්නාහිර | 5,825,327 |
| මධ්‍යම | 5,977,233 |
| දකුණු | 2,820,932 |
| උතුරු | 2,734,919 |
| වයඹ | 3,108,526 |
| උතුරු මැද | 2,355,078 |
| ඌව | 3,516,196 |
| සබරගමුව | 2,901,206 |
| නැගෙනහිර | 2,998,169 |
| **එකතුව** | **32,237,586** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු - 2015*

පළාත් විසින් ඉදිරිපත් කරන ලද පුනරාවර්තන අවශ්‍යතාවයන් තක්සේරු කිරීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි මුදල් කොමිෂන් සභාව සැලකිලිමත් වේ. එනම්,

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය,
- තත්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු,
- රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා විසින් එකඟත්වයට පැමිණි නව පත්වීම්,
- පුද්ගල පඩිනඩි, හිඟ වැටුප් හා කාර්යමණ්ඩලය පිළිබඳ ඇස්තමේන්තු,
- ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරිම ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම් පිළිබඳ ඇස්තමේන්තු,
- ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයින් සඳහා දීමනා සහ පළාත් පාලන ආයතන හා අනෙකුත් ආයතනවලට සිදු කළ යුතු මාරු කිරීම් යනාදියයි.

## වගුව 8: පළාත් තත්‍ය කාර්යමණ්ඩල සඳහා තක්සේරු කරන ලද පුද්ගල පඩිනඩි - 2015

| පළාත | තත්‍ය කාර්ය මණ්ඩලය | පළාතට අයත් කොටසේ % | පුද්ගල පඩි නඩි (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වැටුප් හා වේතන | පළාතට අයත් කොටසේ % | අතිකාල හා නිවාඩු දින ගෙවීම් | පළාතට අයත් කොටසේ % | වෙනත් දීමනා | පළාතට අයත් කොටසේ % | එකතුව (පුද්ගල පඩි නඩි) | පළාතට අයත් කොටසේ % |
| බස්නාහිර | 55,962 | 18 | 15,123,640 | 20 | 1,777,218 | 19 | 9,622,273 | 19 | 26,523,131 | 19 |
| මධ්‍යම | 41,494 | 13 | 10,232,891 | 13 | 1,599,499 | 17 | 6,502,763 | 13 | 18,335,153 | 13 |
| දකුණු | 38,936 | 12 | 9,426,676 | 12 | 839,440 | 9 | 6,240,225 | 12 | 16,506,341 | 12 |
| උතුරු | 26,631 | 9 | 5,811,335 | 8 | 833,074 | 9 | 4,416,881 | 9 | 11,061,290 | 8 |
| වයඹ | 39,481 | 13 | 9,616,323 | 13 | 1,039,135 | 11 | 6,313,238 | 12 | 16,968,696 | 12 |
| උතුරු මැද | 22,934 | 7 | 5,005,704 | 7 | 851,747 | 9 | 3,399,471 | 7 | 9,256,922 | 7 |
| ඌව | 26,176 | 8 | 6,260,145 | 8 | 999,438 | 10 | 4,119,472 | 8 | 11,379,055 | 8 |
| සබරගමුව | 30,364 | 10 | 7,697,891 | 10 | 1,020,977 | 11 | 5,454,540 | 11 | 14,173,408 | 10 |
| නැගෙනහිර | 30,125 | 10 | 6,845,715 | 9 | 627,166 | 7 | 4,746,971 | 9 | 12,219,852 | 9 |
| | **312,103** | **100** | **76,020,320** | **100** | **9,587,694** | **100** | **50,815,834** | **100** | **136,423,848** | **100** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු 2015 සහ මුදල් කොමිෂන් සභාව*

*සටහන: පුරප්පාඩු හැර*

## වගුව 9: පළාත් සඳහා තක්සේරු කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් - 2015*

(රු.'000)

| පළාත | පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් හැර වෙනත් පුනරාවර්තන වියදම් | පළාත් % | පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් | පළාත් % | පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් සමග වෙනත් පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| බස්නාහිර | 6,514,758 | 20 | 5,670,936 | 43 | **12,185,694** |
| මධ්‍යම | 3,501,533 | 11 | 1,611,544 | 12 | **5,113,077** |
| දකුණු | 3,726,400 | 12 | 1,269,896 | 10 | **4,996,296** |
| උතුරු | 2,867,320 | 9 | 1,184,956 | 9 | **4,052,276** |
| වයඹ | 3,568,222 | 11 | 1,018,661 | 8 | **4,586,883** |
| උතුරු මැද | 1,953,441 | 6 | 365,935 | 3 | **2,319,376** |
| ඌව | 3,316,871 | 10 | 536,904 | 4 | **3,853,775** |
| සබරගමුව | 3,708,009 | 12 | 871,887 | 7 | **4,579,896** |
| නැගෙනහිර | 2,935,223 | 9 | 810,286 | 6 | **3,745,509** |
| | **32,091,777** | **100** | **13,341,005** | **100** | **45,432,782** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

**සටහන: මුද්දර බදු හා උසාවි දඩ නොමැතිව*

### 3.4 පුනරාවර්තන අරමුදල් පළාත් අතර වෙන් කිරීම

මුදල් කොමිෂන් සභාව පළාත් විසින් ඉදිරිපත් කරනු ලැබූ පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතා පිළිබඳව පරිපූර්ණ විශ්ලේෂණයන් සිදු කර පළාත්වල පුනරාවර්තන වියදම් අවශ්‍යතාවය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදනයන් පිළිබඳව මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කරනු ලබයි. එකඟ වූ ප්‍රතිපාදන පළාත් අතර බෙදා වෙන් කළ ආකාරය වගු අංක 10 හි දැක්වේ.

**වගුව 10: සාමූහික ප්‍රදාන වෙන් කිරීම - 2015**

**(රු.'000)**

| පළාත | සාමූහික ප්‍රදාන |
|---|---:|
| බස්නාහිර | 10,000,000 |
| මධ්‍යම | 18,000,000 |
| දකුණු | 16,000,000 |
| උතුරු | 12,800,000 |
| වයඹ | 16,750,000 |
| උතුරු මැද | 10,700,000 |
| ඌව | 12,600,000 |
| සබරගමුව | 15,000,000 |
| නැගෙනහිර | 13,750,000 |
| **එකතුව** | **125,600,000** |

*මූලාශ්‍රය: අයවැය අංශය, මුදල් කොමිෂන් සභාව*

පළාත්වලට වෙන් කරනු ලබන ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රමාණයක් පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරනු ලබන බවට හා සංවර්ධන වැඩ සඳහා අඩු අවධානයක් ඇති බවට කරුණු දැක්වී ඇත. එසේ වුවද, ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා පළාත් කාර්යමණ්ඩලයෙන් විශාල සේවාවක් ඉටු වී ඇති බව සඳහන් කළ යුතුය. සමාජ-ආර්ථික දර්ශකවල සිදු වී ඇති ධනාත්මක වර්ධනය නිරීක්ෂණය කිරීමේ දී, පළාත් සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා අංශ විෂයෙහි සුවිශේෂ කාර්යභාරයක් ඉටු කර ඇති බව පෙනී යයි. අධ්‍යාපන හා සෞඛ්‍ය අංශවල සේවයේ යොදවා ඇති පිරිසෙන් වැඩි පිරිසක් ගුරුවරුන්, විදුහල්පතිවරුන්, වෛද්‍යවරුන් හා පරිපූරක වෛද්‍ය වෘත්තිකයින් වන අතර, ඔවුන්ගේ වැටුප් පළාත් පුනරාවර්තන වියදම් තුළින් ගෙවනු ලබයි.

රජයේ නිළධාරීන් සඳහා රජය විසින් හඳුන්වාදෙන ලද රු. 10,000/- වැටුප් වැඩි කිරීම, පහත අයුරින් කොටස් වශයෙන් ගෙවීම සිදුකෙරේ.

- 2015 ජනවාරි මාසය සඳහා රු. 3,000/- ක්.
- 2015 පෙබරවාරි සිට ජූනි දක්වා අතිරේක රු. 5,000/- ක්.
- 2015 ජූලි සිට දෙසැම්බර් දක්වා අතිරේක රු. 2,000/- ක්.

එම තීරණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2015 සහ 2015.02.11 දිනැති චක්‍රලේඛයෙන් බල ගන්වා ඇත. මෙම වැටුප් වැඩිවීම් ගෙවීම සඳහා පළාත්වලට අවශ්‍ය වන අතිරේක මූල්‍ය ප්‍රතිපාදන වගු අංක 11 හි දැක්වේ.

වගුව 11: 2015 වසරේ අයවැය තුළින් වැටුප් වැඩිවීම වෙනුවෙන් පළාත් කාර්ය මණ්ඩලය සඳහා ඇස්තමේන්තු කරන ලද අමතර ප්‍රතිපාදන

(රු.මි)

| පළාත | සේවක සංඛ්‍යාව | රු. 3,000 දීමනාව 2015 ජනවාරි | රු. 8,000 දීමනාව 2015 පෙබරවාරි සිට ජූනි දක්වා | රු. 10,000 දීමනාව 2015 ජූලි සිට දෙසැම්බර් දක්වා | මුළු අවශ්‍යතාවය |
|---|---|---|---|---|---|
| බස්නාහිර | 57,084 | 171.25 | 1,826.69 | 3,995.88 | 5,993.88 |
| මධ්‍යම | 40,988 | 122.96 | 1,311.62 | 2,869.16 | 4,303.78 |
| දකුණු | 41,270 | 123.81 | 1,320.64 | 2,888.90 | 4,333.39 |
| උතුරු | 26,650 | 79.95 | 852.8 | 1,865.50 | 2,798.28 |
| වයඹ | 43,350 | 130.05 | 1387.20 | 3,034.50 | 4,551.79 |
| උතුරු මැද | 24,405 | 73.22 | 780.96 | 1,708.35 | 2,562.55 |
| ඌව | 27,648 | 82.94 | 884.74 | 1,935.36 | 2,903.07 |
| සබරගමුව | 30,435 | 91.31 | 973.92 | 2,130.45 | 3,195.71 |
| නැගෙනහිර | 29,963 | 89.89 | 958.82 | 2,097.41 | 3,146.14 |
| **එකතුව** | **321,793** | **965.38** | **10,297.38** | **22,525.51** | **33,788.59** |

*මූලාශ්‍රය: අයවැය අංශය, මුදල් කොමිෂන් සභාව*

## 3.5 පළාත් පාලන ආයතනවල මූල්‍යනය

පළාත් වෙතින් පළාත් පාලන ආයතනවලට මාරු කරනු ලබන අරමුදල්වල ප්‍රධානම කොටස වනුයේ අනුමත තත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන වැටුප් සහ පළාත් පාලන මහජන නියෝජිතයින් සඳහා ගෙවනු ලබන දීමනාවන්ය. වර්තමානයේ දී, කාර්ය මණ්ඩල වැටුප් මුළුමනින්ම පාහේ සාමූහික ප්‍රදාන මගින් ප්‍රතිපූරණය කරනු ලැබේ. කොන්ත්‍රාත් හා තාවකාලික පදනමින් බඳවාගත් සේවකයින් සඳහා ආරම්භයේ දී වැටුප් ගෙවනු ලැබූයේ උපයාගත් ආදායම්වලින් වුවද, මෑතදී මෙම සේවකයින් අනුමත කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරන ලදී. ඒ අනුව, සේවකයින්ගේ මුළු වැටුප් ප්‍රමාණය සාමූහික ප්‍රදානවලින් කරනු ලබන මාරුකිරීම් මගින් ගෙවනු ඇත. එබැවින්, රැස් කරන ලද ආදායම ජනතා සේවා සැපයුමට වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස යෙදවීම සිදු කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

**වගුව 12: පළාත් පාලන ආයතනවල සේවක වැටුප් හා මහජන නියෝජිතයින්ගේ දීමනා සඳහා මුදල් වෙන් කිරීම - 2015**

| පළාත | මහ නගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා | පළාත් පාලන ආයතන මුළු එකතුව | මහජන නියෝජිතයින්ගේ දීමනා | | කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූරණය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සාමාජිකයන් ගණන | දීමනාව (රු.'000) | සත්‍ය | මුදල (රු.'000) |
| බස්නාහිර | 7 | 14 | 27 | 48 | 884 | 77,867 | 17,193 | 5,593,069 |
| මධ්‍යම | 4 | 6 | 33 | 43 | 634 | 43,098 | 4,896 | 1,568,446 |
| දකුණු | 3 | 4 | 42 | 49 | 582 | 40,188 | 4,004 | 1,229,708 |
| උතුරු | 1 | 5 | 28 | 34 | 398 | 27,138 | 3,728 | 1,157,818 |
| වයඹ | 1 | 3 | 29 | 33 | 500 | 32,916 | 3,209 | 985,745 |
| උතුරු මැද | 1 | 0 | 25 | 26 | 294 | 20,034 | 1123 | 345,901 |
| ඌව | 2 | 1 | 25 | 28 | 319 | 22,379 | 1,669 | 514,525 |
| සබරගමුව | 1 | 3 | 25 | 29 | 424 | 28,866 | 2,149 | 843,021 |
| නැගෙනහිර | 3 | 5 | 37 | 45 | 447 | 30,245 | 2,376 | 780,041 |
| **එකතුව** | **23** | **41** | **271** | **335** | **4482** | **322,731** | **40,347** | **13,018,274** |

*මූලාශ්‍රය: අයවැය අංශය, මුදල් කොමිෂන් සභාව*

මීට අමතරව, 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අයවැයෙන් සිදු කළ වැටුප් වැඩි කිරීම් වෙනුවෙන් ද පළාත් පාලන ආයතනවලට අතිරේක ප්‍රතිපාදන මාරු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන පිළිබඳ විස්තර වගුව 13 හි දක්වා ඇත.

**වගුව 13: 2015 වසරේ අයවැය තුළින් වැටුප් වැඩිවීම වෙනුවෙන් පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා ඇස්තමේන්තු කරන ලද අමතර ප්‍රතිපාදන**

**(*රු.මි.*)**

| පළාත | සේවක සංඛ්‍යාව | රු. 3,000 දීමනාව 2015 ජනවාරි | රු. 8,000 දීමනාව 2015 පෙබරවාරි සිට ජූනි දක්වා | රු. 10,000 දීමනාව 2015 ජූලි සිට දෙසැම්බර් දක්වා | මුළු අවශ්‍යතාවය |
|---|---|---|---|---|---|
| බස්නාහිර | 17,193 | 51.58 | 550.18 | 1,203.51 | 1,805.28 |
| මධ්‍යම | 4,875 | 14.63 | 156 | 341.25 | 511.88 |
| දකුණු | 4,856 | 14.57 | 155.39 | 339.92 | 509.88 |
| උතුරු | 3,728 | 11.18 | 119.3 | 260.96 | 391.44 |
| වයඹ | 3,844 | 11.53 | 123.01 | 269.08 | 403.62 |
| උතුරු මැද | 1,599 | 4.8 | 51.17 | 111.93 | 167.9 |
| ඌව | 2,547 | 7.64 | 81.5 | 178.29 | 267.44 |
| සබරගමුව | 2,045 | 6.14 | 65.44 | 143.15 | 214.73 |
| නැගෙනහිර | 3,031 | 9.09 | 96.99 | 212.17 | 318.26 |
| එකතුව | **43,718** | **131.15** | **1,398.98** | **3,060.26** | **4,590.43** |

*මූලාශ්‍රය: අයවැය අංශය, මුදල් කොමිෂන් සභාව*

### 3.6 පළාත්වල මුළු අයවැය තත්ත්වය

සියලුම පළාත්වලට අදාලව ආදායමේ, වියදමේ සහ රජයේ ප්‍රදානවල එකතුව වගුව 14 මගින් දැක්වේ.

2004-2013 කාලය තුළ සියලුම පළාත්වල ආදායමේ එකතුව රු.මි. 13,522 සිට රු.මි.50,469 දක්වා ඉහළ ගොස් ඇති අතර, මෙය 273% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. සාමාන්‍යයෙන් පළාත්වල බදු ආදායම, මුළු ආදායමෙන් 85% ක් පමණ වේ. අදාල කාල පරිච්ඡේදය තුළ, බදු ආදායමේ වැඩි වීම 280% කි. පළාත්වල බදු නොවන ආදායම රු.මි. 1,978 සිට රු.මි. 6,532 දක්වා වර්ධනය වී ඇති අතර, එය 230% ක ඉහළ යෑමකි.

වගුව 14 මගින් පෙන්වාදෙන පරිදි, සියලුම පළාත්වල මුළු වියදම මෙම කාලය තුළ රු.මි. 56,964 සිට රු.මි. 186,062 දක්වා වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙය 226% ක වැඩි වීමකි. සමස්තයක් ලෙස පුනරාවර්තන වියදම, මුළු වියදමෙන් 83% ක් පමණ වන අතර, එය අදාල කාල සීමාව තුළ රු.මි. 46,308 සිට රු.මි. 156,799 ක් දක්වා වැඩිවී ඇත. මෙම වැඩිවීමේ ප්‍රතිශතය 238%කි. ප්‍රාග්ධන වියදම රු.මි. 10,656 සිට රු.මි. 29,263 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය 175% ක වැඩි වීමකි.

වගුව 14 මගින් දැක්වෙන පරිදි, විදේශාධාර ව්‍යාපෘති ද ඇතුළත්ව රජය මගින් පළාත්වලට සපයනු ලබන ප්‍රදාන රු.මි. 45,848 සිට රු.මි. 135,593 දක්වා 196% කින් ඉහළ ගොස් තිබේ.

පුද්ගල පඩිනඩි හා අනෙකුත් පුනරාවර්තන වියදම් ඇතුළත් සාමූහික ප්‍රදාන, රජයේ මුළු ප්‍රදානවලින් 80%ක් වේ.

## වගුව 14: පළාත්වල මුළු අයවැය තත්ත්වය

**(රු.මි.)**

| ශීර්ෂය | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 13,522 | 16,133 | 19,481 | 25,868 | 31,368 | 29,433 | 36,829 | 40,990 | 49,235 | 50,469 |
| බදු ආදායම | 11,544 | 13,819 | 16,656 | 21,473 | 25,992 | 24,907 | 31,049 | 34,658 | 41,657 | 43,937 |
| භාණ්ඩ හා සේවාමත බදු | 7,783 | 9,300 | 11,074 | 15,700 | 19,969 | 19,649 | 24,336 | 20,671 | 25,119 | 26,802 |
| පිරිවැටුම් බදු / ජාතිය ගොඩනැගීමේ බද්ද | 5,948 | 7,202 | 8,626 | 12,962 | 16,641 | 15,845 | 19,986 | 15,550 | 18,927 | 19,569 |
| බලපත්‍ර ගාස්තු | 1,809 | 2,078 | 2,410 | 2,695 | 3,269 | 3,757 | 4,280 | 5,030 | 5,144 | 6,544 |
| වෙනත් බදු | 26 | 20 | 38 | 43 | 59 | 46 | 70 | 91 | 1,048 | 688 |
| දේපලමත බදු | 3,761 | 4,519 | 5,512 | 5,773 | 6,023 | 5,258 | 6,713 | 13,987 | 16,538 | 17,135 |
| බදු නොවන ආදායම් | 1,978 | 2,314 | 2,895 | 4,395 | 5,376 | 4,526 | 5,780 | 6,332 | 7,578 | 6,532 |
| පොළී, ලාභ හා ලාභාංශ | 744 | 811 | 1,181 | 2,007 | 3,070 | 2,188 | 1,539 | 1,732 | 1,921 | 1,583 |
| විකුණුම් හා අයකිරීම් | 1,234 | 1,503 | 1,714 | 2,388 | 2,306 | 2,338 | 4,241 | 4,600 | 5,657 | 4,969 |
| | | | | | | | | | | |
| මුළු වියදම | 56,964 | 73,100 | 94,471 | 113,067 | 120,011 | 130,260 | 145,491 | 157,373 | 161,341 | 186,062 |
| පුනරාවර්තන වියදම | 46,308 | 59,132 | 76,428 | 92,721 | 103,199 | 111,336 | 119,162 | 129,600 | 139,121 | 156,799 |
| ක්‍රියාකාරී පදනම | 46,308 | 59,132 | 76,428 | 92,721 | 103,199 | 111,336 | 119,162 | 129,600 | 139,121 | 156,799 |
| පළාත් පරිපාලන | 3,606 | 4,682 | 6,648 | 7,100 | 10,889 | 6,890 | 10,550 | 7,163 | 12,551 | 14,195 |
| ආර්ථික සේවා | 1,976 | 2,423 | 3,146 | 3,797 | 4,253 | 4,504 | 4,771 | 8,345 | 2,383 | 3,325 |
| සමාජ සේවා | 40,726 | 52,027 | 66,634 | 81,824 | 88,057 | 99,942 | 103,841 | 114,092 | 124,187 | 139,280 |
| ආර්ථික පදනම | 46,308 | 59,132 | 76,428 | 92,721 | 103,199 | 111,336 | 119,162 | 129,600 | 139,121 | 156,799 |
| වැටුප් හා වේතන | 36,079 | 46,479 | 60,497 | 74,711 | 79,717 | 86,547 | 91,644 | 101,886 | 108,246 | 116,757 |
| වෙනත් | 10,229 | 12,653 | 15,931 | 10,611 | 23,482 | 24,789 | 27,518 | 27,714 | 30,875 | 40,043 |
| | | | | | | | | | | |
| ප්‍රාග්ධන වියදම | 10,656 | 13,878 | 18,043 | 20,346 | 16,812 | 18,924 | 26,326 | 27,773 | 22,220 | 29,263 |
| ප්‍රාග්ධන භාණ්ඩ අත්පත්කර ගැනීම | 923 | 1,348 | 1,149 | 1,248 | 2,551 | 2,516 | 2,902 | 4,302 | 2,736 | 4,207 |
| ප්‍රාග්ධන මාරුකිරීම් | 175 | 205 | 137 | 150 | 511 | 510 | 2,496 | 3,700 | 869 | 173 |
| පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති | 3,792 | 5,693 | 7,857 | 9,058 | 8,578 | 10,945 | 11,683 | 9,953 | 5,901 | 6,429 |
| විශේෂ ව්‍යාපෘති | 4,988 | 5,641 | 8,331 | 9,253 | 2,603 | 3,393 | 7,439 | 7,973 | 11,452 | 18,100 |
| වෙනත් | 778 | 991 | 969 | 637 | 2,569 | 1,560 | 1,809 | 1,845 | 1,263 | 356 |
| | | | | | | | | | | |
| රජෙය් මාරුකිරීම් | 45,848 | 59,695 | 79,029 | 88,317 | 88,942 | 93,999 | 107,032 | 116,383 | 112,106 | 135,593 |
| සාමූහික ප්‍රදාන | 35,892 | 47,107 | 62,342 | 70,742 | 76,773 | 77,386 | 85,299 | 94,603 | 91,892 | 108,801 |
| උපමාන පාදක ප්‍රදාන | 803 | 817 | 790 | 1,208 | 2,304 | 2,276 | 2,612 | 3,854 | 2,861 | 2,264 |
| අනුරූපිත ප්‍රදාන | 311 | 273 | 221 | 205 | | | | | | |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 3,854 | 5,561 | 7,345 | 6,995 | 7,262 | 10,945 | 11,683 | 9,953 | 5,901 | 6,429 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන | 4,968 | 5,937 | 8,331 | 9,167 | 2,603 | 3,393 | 7,439 | 7,973 | 11,452 | 18,100 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

### 3.7 පළාත් මුදල් ප්‍රකාශය

යම් මුදල් වර්ෂයකට අදාල වාර්ෂික මුදල් ප්‍රකාශය තුළ පළාත් සභාවකට අයත් ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති ඇතුළත් වේ. ව්‍යවස්ථාමය විධිවිධාන අනුව, පළාතේ ආණ්ඩුකාරවරයා විසින් කිසියම් වර්ෂයකට අදාල මූල්‍ය ප්‍රකාශය එම පළාතේ අපේක්ෂිත ආදායම් සහ වියදම් ඇතුළත්ව පිළියෙල කර අදාල වර්ෂය ආරම්භයට අවම වශයෙන් මාස 03 කට පෙර අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරවීමට විධිවිධාන යෙදිය යුතුය. පළාත් බලධාරීන් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ පදනම් කරගෙන ජාතික අයවැයෙන් පළාත්වලට මාරු කරනු ලබන ප්‍රතිපාදන වෙන් කිරීම් ඉල්ලනු ලබයි. පළාත් මුදල් ප්‍රකාශය පිළියෙල කරනු ලබනුයේ එම ප්‍රතිපාදන වෙන් කිරීම්වලට අදාල තොරතුරු පදනම් කරගෙනය. පළාතේ මූල්‍ය රෙගුලාසි හා මුදල් කොමිෂන් සභාව විසින් ලබාදෙන මාර්ගෝපදේශවලට අනුකූලව විවිධ අංශවලට වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන පදනම් කරගෙන පළාත් විසින් සිය වාර්ෂික සංවර්ධන සැලසුම් පිළියෙල කරනු ලබයි.

## 4. පළාත් ආදායම්

පළාත් ආදායම් පහත දැක්වෙන අයුරින් ප්‍රධාන කොටස් දෙකක් යටතේ උත්පාදනය වේ.

i. රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2010 යටතේ පළාත් සභාවලට මාරු කරන ආදායම් සහ

ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 36 (1) සිට 36 (20) වගන්තිවලින් හඳුනාගෙන ඇති පළාත්වලට බලය පවරන ලද විවිධ බදු, ගාස්තු, අය කිරීම් හා දඩ ආදිය මගින් පළාත්වලට හිමි ආදායමය.

### 4.1 රජයේ ආදායම් මාරු කිරීම

රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 1/2010 ට අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, රේගු අධ්‍යක්ෂක ජනරාල් දෙපාර්තමේන්තුව හා මෝටර් රථ කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වැනි ජාතික මට්ටමේ ආයතන විසින් එකතු කරනු ලබන ආදායම් පහත දැක්වෙන ආකාරයෙන් පළාත්වලට මාරු කළ යුතු වේ.

- ජාතිය ගොඩනැගීමේ බද්දෙන් - 33 1/3 %
- මුද්දර ගාස්තුවලින් - 100%
- රථ වාහන ලියාපදිංචි ගාස්තුවලින් - 70%

එකතු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු සති දෙකකට වරක් පහත දැක්වෙන ප්‍රතිශතයන්ට අනුව විශේෂිත බැංකු ගිණුම් හරහා පළාත්වලට මාරු කළ යුතු වේ. මෙම අනුපාත මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය යටතේ කලින් කලට මහා භාණ්ඩාගාරය විසින් වෙනස් කරනු ඇත.

| පළාත | අනුපාතය |
|---|---|
| බස්නාහිර | 48% |
| මධ්‍යම | 9% |
| දකුණු | 9% |
| වයඹ | 9% |
| සබරගමුව | 5% |
| උතුරු මැද | 5% |
| ඌව | 5% |
| නැගෙනහිර | 5% |
| උතුරු | 5% |

**වගුව 15: රාජ්‍ය ආදායම මාරු කිරීම - 2013 සහ 2014**

*( රු.මි.)*

| පළාත | 2013 | | 2014 | |
|---|---|---|---|---|
| | ඉලක්ක | මාරු කිරීම් | ඉලක්ක | ජුනි දක්වා මාරු කිරීම් * |
| බස්නාහිර | 18,240 | 11,947 | 16,800 | 7,120 |
| මධ්‍යම | 3,420 | 2,251 | 3,150 | 1,339 |
| දකුණු | 3,420 | 2,252 | 3,150 | 1,319 |
| උතුරු | 1,900 | 1,218 | 1,750 | 760 |
| වයඹ | 3,420 | 2,222 | 3,150 | 1,421 |
| උතුරු මැද | 1,900 | 1,412 | 1,750 | 793 |
| ඌව | 1,900 | 1,742 | 1,750 | 669 |
| සබරගමුව | 1,900 | 1,297 | 1,750 | 573 |
| නැගෙනහිර | 1,900 | 1,406 | 1,750 | 640 |
| **එකතුව** | **38,000** | **25,746** | **35,000** | **14,634** |

*මූලාශ්‍රය: පළාත් සභා මාසික ආදායම් වාර්තා - 2013 හා 2014*
*තාවකාලික

## 4.2 බලය පවරන ලද ආදායම් මූලාශ්‍රවලින් එකතු කරනු ලබන ආදායම්

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 (1) සිට 36 (20) දක්වා වගන්තිවලින් පළාත්වලට හිමි බදු හා බදු නොවන ආදායම් මූලාශ්‍ර හඳුනාගෙන ඇත. රථ වාහන ලියාපදිංචි ගාස්තු, සුරා බදු, මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් මේ අතුරින් ප්‍රධාන වේ. පළාත් සභා විසින් එකතු කරනු ලබන මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් පළාත් පාලන ආයතන වෙත වාර්ෂිකව මාරු කරනු ලබයි. පළාත් සභා විසින් උපයනු ලැබූ ආදායම අතුරින්, මුද්දර ගාස්තු ප්‍රමුඛතාවයක් ගනී. පළාත්වල ප්‍රධාන ප්‍රභවයන්ගෙන් 2013 හා 2014 (ජුනි දක්වා) එකතු කරනු ලැබූ ආදායම් වගු අංක 16 හා 17 හි දැක්වේ.

### වගුව 16: බලය පවරන ලද මූලාශ්‍ර යටතේ එකතු කරන ලද පළාත් ආදායම් - 2013

*( රු.'000)*

| පළාත | ව්‍යාපාර පිරිවැටුම් බදු* | වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු | සුරා බදු | මුද්දර ගාස්තු | උසාවි දඩ | වෙනත්** | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 75,540 | 2,931,120 | 327,360 | 7,341,490 | 761,160 | 2,137,530 | 13,574,200 |
| මධ්‍යම | 16,338 | 628,155 | 195,998 | 871,145 | 101,880 | 279,442 | 2,092,958 |
| දකුණු | 17 | 671,059 | 74,979 | 1,000,897 | 243,895 | 236,696 | 2,227,543 |
| උතුරු*** | - | 189,049 | - | - | - | 121,879 | 310,928 |
| වයඹ | 1,856 | 851,195 | 84,082 | 893,639 | 316,462 | 329,784 | 2,477,018 |
| උතුරු මැද | 2,800 | 349,998 | 23,885 | 65,379 | 152,414 | 320,005 | 914,481 |
| ඌව | 4,105 | 246,211 | 54,076 | 144,537 | 100,418 | 183,134 | 732,481 |
| සබරගමුව | - | 439,847 | 54,541 | 405,475 | 102,234 | 174,450 | 1,176,547 |
| නැගෙනහිර | - | 281,380 | 19,789 | 228,149 | 131,232 | 138,977 | 799,527 |
| **එකතුව** | **100,656** | **6,588,014** | **834,710** | **10,950,711** | **1,909,695** | **3,921,897** | **24,305,683** |

*මූලාශ්‍රය: පළාත් සභා මාසික ආදායම් වාර්තා* - 2013
** 2010 දක්වා හිඟ ව්‍යාපාර පිරිවැටුම් බදු එකතු කිරීම*
*** වෙනත් යටතේ කුලී, පොලී, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම, ඔට්ටු බදු ආදිය ඇතුළත්ය*
**** පළාත් සභාව විසින් ප්‍රඥප්තියක් සකස් කර නොමැති හෙයින්, පළාත් ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි.*

### වගුව 17: බලය පවරන ලද මූලාශ්‍ර යටතේ එකතු කරන ලද පළාත් ආදායම් (ජුනි දක්වා) - 2014*

*(රු.'000)*

| පළාත | ව්‍යාපාර පිරිවැටුම් බදු** | වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු | සුරා බදු | මුද්දර ගාස්තු | උසාවි දඩ | වෙනත්*** | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 25,140 | 1,581,270 | 104,570 | 4,561,450 | 250,970 | 1,189,150 | 7,712,550 |
| මධ්‍යම | 5,470 | 320,287 | 90,809 | 438,914 | 42,429 | 174,929 | 1,072,838 |
| දකුණු | 4,107 | 371,094 | 26,821 | 525,753 | 92,671 | 118,520 | 1,138,966 |
| උතුරු | - | 107,613 | - | 626 | - | 41,108 | 149,347 |
| වයඹ | 779 | 458,411 | 42,227 | 540,291 | 120,121 | 159,902 | 1,321,731 |
| උතුරු මැද | 11,299 | 188,471 | 69,462 | 81,812 | 73,435 | 98,864 | 523,343 |
| ඌව | 441 | 133,547 | 20,684 | 26,805 | 45,335 | 80,744 | 307,556 |
| සබරගමුව | 0.05 | 226,172 | 19,836 | - | 48,596 | 114,607 | 409,211 |
| නැගෙනහිර | - | 147,643 | 16,937 | 125,610 | 48,113 | 75,310 | 413,613 |
| **එකතුව** | **47,237** | **3,534,507** | **391,346** | **6,301,260** | **721,670** | **2,053,135** | **13,049,156** |

*මූලාශ්‍රය: පළාත් සභා මාසික ආදායම් වාර්තා* - 2014

* *තාවකාලික*
** *2010 දක්වා හිඟ ව්‍යාපාර පිරිවැටුම් බදු එකතු කිරීම*
*** *වෙනත් යටතේ කුලී, පොලී, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම, ඔට්ටු බදු ආදිය ඇතුළත්ය*

### 4.3 2015 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන

පළාත් සම්බන්ධයෙන් ආදායම් ඉලක්ක සැකසීමේ ක්‍රමවේදය, පළාත් ආදායමට අදාල ප්‍රධාන මූලාශ්‍ර දෙක වන රජයේ ආදායම් පළාත්වලට මාරු කිරීම, බලය පවරන ලද මූලාශ්‍රවලට අදාල ඉලක්කගත ආදායම මත පදනම් වේ.

මෙම ක්‍රම දෙක යටතේ පුරෝකථනය කරනු ලබන මුළු ආදායම, පළාත් සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පුනරාවර්තන අවශ්‍යතාවයෙන් අඩු කරනු ලැබේ. පළාත් සඳහා ආදායම් ඉලක්ක සැකසීමේදී මුදල් කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරය හා පළාත් අධිකාරීන් සමඟ උපදේශනාත්මක අදහස් හුවමාරුවක නිරත වේ.

#### 4.3.1 රජයේ ආදායම් මාරු කිරීම

2010.12.29 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2010 ට අනුව මහාභාණ්ඩාගාරය විසින් පළාත්වලට මාරු කළ යුතු වාර්ෂික මුදල් ප්‍රමාණය තීරණය කරනු ලබයි. 2015 වර්ෂයේදී පළාත්වලට මාරුකළ යුතු රජයේ ආදායම් පුරෝකථන පහත දැක්වෙන ප්‍රතිශතවලට අනුව සිදු කරන ලදී. මෙම ප්‍රතිශත, මුදල් කොමිෂන් සභාවේ හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවයෙන් තීරණය කර ඇත.

| පළාත | අනුපාතය |
|---|---|
| බස්නාහිර | 48% |
| මධ්‍යම /දකුණු/ වයඹ | 9% |
| සබරගමුව /උතුරු මැද/ ඌව/ නැගෙනහිර/ උතුරු | 5% |

රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 1/2010 අනුව මහා භාණ්ඩාගාරය විසින් ජාතික මට්ටමින් එකතු කරන ආදායමින් රු.මි. 39,500 ක් 2015 වර්ෂයේ දී පළාත් සභා වෙත මාරු කිරීම සඳහා වෙන් කර ඇත.

**වගුව 18: පළාත්වලට මාරු කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද රජයේ ආදායම - 2015**

*(රු.'000)*

| පළාත | මාරු කිරීම් | පළාතට අයත් කොටසේ % |
|---|---|---|
| බස්නාහිර | 18,960,000 | 48 |
| මධ්‍යම | 3,555,000 | 9 |
| දකුණු | 3,555,000 | 9 |
| උතුරු | 1,975,000 | 5 |
| වයඹ | 3,555,000 | 9 |
| උතුරු මැද | 1,975,000 | 5 |
| ඌව | 1,975,000 | 5 |
| සබරගමුව | 1,975,000 | 5 |
| නැගෙනහිර | 1,975,000 | 5 |
| **එකතුව** | **39,500,000** | **100** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

#### 4.3.2 බලය පවරන ලද මූලාශ්‍ර සඳහා ආදායම් ඉලක්ක

බලය පවරන ලද ආදායම් මූලාශ්‍ර සඳහා ඉලක්ක ලබාදීම, වාර්ෂිකව පළාත් සභා විසින් ඉදිරිපත් කරනු ලබන ආදායම් තක්සේරුව සහ පසුගිය වර්ෂවල එක් එක් පළාතේ ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය මෙන්ම, 2014 වර්ෂයේ මුල් මාස හයෙහි කාර්යසාධනය යන කරුණු මත පදනම් වේ.

මුදල් කොමිෂන් සභාව විසින් 2015 වර්ෂය සඳහා මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ද ඇතුළත්ව පුරෝකථනය කරන ලද ආදායම රු.මි. 24,500 කි. 2015 වර්ෂය සඳහා මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් හැර පුරෝකථනය කරන ලද ආදායම රු.මි. 12,177.4 කි. මේ පිළිබඳ තොරතුරු වගු අංක 19 හි දැක්වේ.

**වගුව 19: 2015 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන**

*(රු.'000)*

| පළාත | මුද්දර ගාස්තු හා උසාවි දඩ ඇතුළත්ව ආදායම් පුරෝකථනය | | | මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර ආදායම් පුරෝකථනය | | |
|---|---|---|---|---|---|---|
| | පළාත් ඇස්තමේන්තුව | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය % ලෙස | පළාත් ඇස්තමේන්තුව | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය % ලෙස |
| බස්නාහිර | 12,444,332 | 13,675,000 | 56 | 4,689,332 | 6,000,000 | 49 |
| මධ්‍යම | 2,072,000 | 2,090,000 | 9 | 1,082,000 | 1,100,000 | 9 |
| දකුණු | 2,154,960 | 2,372,000 | 10 | 973,960 | 1,200,000 | 10 |
| උතුරු | 258,859 | 348,000 | 1 | 258,350 | 347,400 | 3 |
| වයඹ | 2,432,000 | 2,620,000 | 11 | 1,207,000 | 1,400,000 | 11 |
| උතුරු මැද | 881,450 | 960,000 | 4 | 653,700 | 710,000 | 6 |
| ඌව | 604,370 | 630,000 | 3 | 354,370 | 420,000 | 3 |
| සබරගමුව | 1,264,840 | 1,065,000 | 4 | 759,840 | 600,000 | 5 |
| නැගෙනහිර | 708,000 | 740,000 | 3 | 418,000 | 400,000 | 3 |
| **එකතුව** | **22,820,811** | **24,500,000** | **100** | **10,396,552** | **12,177,400** | **100** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු 2015 සහ අයවැය අංශය, මුදල් කොමිෂන් සභාව*

සමස්ත ආදායමෙන් පළාත් පාලන ආයතන වෙත මාරු කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම රු.මි.12,322.6 කි. එක් එක් පළාත අනුව එම ඇස්තමේන්තු ආදායම බෙදී යන ආකාරය වගු අංක 20 හි දැක්වේ.

**වගුව 20: 2015 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ**

*(රු.'000)*

| පළාත | මුද්දර බදු | උසාවි දඩ | එකතුව | පළාතට අයත් කොටසේ % |
|---|---|---|---|---|
| බස්නාහිර | 7,000,000 | 675,000 | 7,675,000 | 62 |
| මධ්‍යම | 890,000 | 100,000 | 990,000 | 8 |
| දකුණු | 950,000 | 222,000 | 1,172,000 | 10 |
| උතුරු | 600 | - | 600 | 0 |
| වයඹ | 900,000 | 320,000 | 1,220,000 | 10 |
| උතුරු මැද | 65,000 | 185,000 | 250,000 | 2 |
| ඌව | 130,000 | 80,000 | 210,000 | 2 |
| සබරගමුව | 380,000 | 85,000 | 465,000 | 4 |
| නැගෙනහිර | 260,000 | 80,000 | 340,000 | 3 |
| **එකතුව** | **10,575,600** | **1,747,000** | **12,322,600** | **100** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

## 4.4 පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමෙන් ආදායම් පදනම පුළුල් කිරීම

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නවවන උපලේඛනයේ 36 (1) සිට 36 (20) දක්වා වගන්තිවල පළාත් සභා වෙත පැවරී ඇති ආදායම් මූලාශ්‍ර දක්වා ඇත. ඉන් සමහරක් පහත පරිදිය.

- ඖෂධ හා වෙනත් රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙළෙඳ බලපත්‍ර මත බදු
- ලොතරැයි සහ තෑගි තරග බදු
- ඔට්ටු බදු
- මෝටර්රථ වාහන බලපත්‍ර ගාස්තු, රේන්ද ගාස්තු සහ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත යටතේ ගාස්තු වැනි බදු නොවන ආදායම්

තවද, මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා අණපනත් මගින් හඳුනාගෙන ඇති, එම එක් එක් ආයතනයට හිමි ප්‍රධාන ආදායම් පහත පරිදිය.

- ඉඩම් මත අය කෙරෙන මුද්දර ගාස්තු
- වරිපනම් ගාස්තු
- බලපත්‍ර ගාස්තු
- බදු කුලී
- දඩ වර්ග
- ප්‍රාග්ධන විකුණුම් මත අය කරන බදු
- සේවා ගාස්තු

පළාත් ආදායම් හා පුනරාවර්තන වියදම් අතර පවත්නා පරතරය පියවා ගැනීම, මුදල් කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශ මත ලබා දෙන සාමූහික ප්‍රදානයන් මගින් සිදු කරනු ලැබේ. 2013 හා 2014 වර්ෂයන්ට අදාලව ඇස්තමේන්තුගත වියදම්, ඇස්තමේන්තුගත ආදායම් හා වෙන් කරනු ලැබූ සාමූහික ප්‍රදාන අංක 21 වගුවේ දැක්වේ.

**වගුව 21: පළාත් ආදායම් හා පළාත් පුනරාවර්තන වියදම් ***

*(රු.මි.)*

| පළාත | 2013 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත මුළු පුනරාවර්තන අවශ්‍යතාවය | අදායම් ඉලක්ක | වෙන්කරන ලද සාමූහික ප්‍රදාන | ඇස්තමේන්තුගත මුළු පුනරාවර්තන අවශ්‍යතාවය | අදායම් ඉලක්ක | වෙන්කරන ලද සාමූහික ප්‍රදාන |
| බස්නාහිර | 29,982 | 23,090 | 8,502 | 35,716 | 22,800 | 9,000 |
| මධ්‍යම | 17,988 | 4,331 | 14,864 | 20,771 | 4,200 | 15,600 |
| දකුණු | 16,716 | 4,464 | 12,908 | 18,444 | 4,300 | 13,800 |
| උතුරු | 11,633 | 2,088 | 10,075 | 13,813 | 2,150 | 11,500 |
| වයඹ | 17,482 | 4,443 | 14,118 | 20,058 | 4,350 | 15,000 |
| උතුරු මැද | 9,632 | 2,369 | 7,346 | 11,367 | 2,450 | 9,000 |
| ඌව | 12,498 | 2,314 | 10,263 | 14,938 | 2,150 | 11,000 |
| සබරගමුව | 17,322 | 2,440 | 13,088 | 18,920 | 2,450 | 14,000 |
| නැගෙනහිර | 13,904 | 2,236 | 11,635 | 14,643 | 2,150 | 12,500 |
| **එකතුව** | **144,156** | **47,775** | **102,800** | **168,669** | **47,000** | **111,400** |

** පළාත් පාලන ආයතනවලට මාරුකිරීම් ඇතුළත්ව*
*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

වගුව 21 හි දැක්වෙන දත්තවලට අනුව, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සමස්ත ඇස්තමේන්තු වියදම සහ ආදායම සැලකිල්ලට ගත්විට බස්නාහිර පළාතට පමණක් සිය පුනරාවර්තන වියදමෙන් විශාල කොටසක් සිය ආදායමෙන් පියවා ගත හැකි බව පෙනේ. අන් සෑම පළාතක්ම සිය ආදායම් හා පුනරාවර්තන වියදම් අතර විශාල පරතරයක් පෙන්නුම් කරන බැවින්, රජයෙන් කරනු ලබන මාරු කිරීම් මත යැපේ. එබැවින්, එවැනි පරතරයන් අඩු කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන් හඳුනා ගත යුතු වේ.

### 4.4.1 පළාත් සභාවල ආදායම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වන නිර්දේශ

මුදල් කොමිෂන් සභාව පළාත්වල හා පළාත් පාලන ආයතනවල ආදායම් ප්‍රවර්ධන ක්‍රමවේදයන් හඳුනා ගැනීම උදෙසා පරිපූර්ණ අධ්‍යයනයක් සිදුකරන ලදී. මෙම අධ්‍යයනයට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හා තෝරාගත් පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් කිහිපදෙනෙකු ඇතුළු අදාල පාර්ශවකරුවන්ගෙන් මේ සම්බන්ධයෙන් යෝජනා ලබා ගන්නා ලදී. ඊට අමතරව, විෂය පිළිබඳ විශේෂඥයින් කිහිප දෙනෙක් ද මෙම අධ්‍යනයට ක්‍රියාකාරීව සහභාගී විය. එම අධ්‍යයනයෙන් හඳුනාගත් ප්‍රධාන නිර්දේශයන් පහත පරිදිය.

- වාර්ෂිකව රු.මි. 12 කට අඩු ආදායමක් ලබන ව්‍යාපරවලින් එකතු කළ අගය මත බදු හෝ, ජාතිය ගොඩනැගීමේ බද්ද හෝ පිරිවැටුම් බද්ද දැනට අය නොකෙරේ. එබැවින්, එවැනි ව්‍යාපාරවලින් බදු ආදායමක් පළාත් සභාවලට ලබා ගැනීමට හැකිවන පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

- ව්‍යවස්ථාමය ප්‍රතිපාදන භාවිතයට ගෙන, ජාතික ලොතරැයි මණ්ඩලය හෝ සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමග ඒකාබද්ධව පළාත් සංවර්ධන ලොතරැයියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම සුදුසුය.

- තේ, රබර්, කුරුඳු හා වෙනත් සුළු අපනයන බෝග හා කාර්මික අපනයන නිෂ්පාදනවලින් ලබන ආදායමින් කොටසක් එම නිෂ්පාදන කරනු ලැබූ පළාතට වෙන් කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම සුදුසුය. දැනට එවැනි අපනයන බෝගවලින් ලැබෙන බදු ආදායම, ඒවාට අගය එකතු කරනු ලබන නාගරික ප්‍රදේශවල ඒකරාශී වේ.

- මාළු තොග අලවියෙන් පළාත් සභාවලට බදු ආදායමක් ලබා ගැනීමට ක්‍රමවේදයක් සැකසීම.

- සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සඳහා පළාත්වල පුළුල් විභවතාවයන් පවතින බව නිරීක්ෂණය වේ. එම අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම සඳහා පළාත් බලධාරීන් තම සම්පත් යෙදවීමෙන් පෞද්ගලික අංශය අභිප්‍රේරණය කිරීමට කටයුතු කළ යුතුය. මෙම අරමුණ (i) අවශ්‍ය යටිතල පහසුකම් හා උපකාරක සේවා සැපයීම තුළින් (ii) සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සඳහා පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ ව්‍යාපාර සිදු කිරීම තුළින් ඉටු කර ගත හැකිය. මෙම කටයුතු මගින් පළාත්වලට බදු අය කිරීමෙන් හා ලාභ බෙදා ගැනීම තුළින් අතිරේක ආදාම් උත්පාදනය කළ හැකි වේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සමහර ආදායම් ප්‍රභවයන් හඳුනාගෙන තිබුණ ද, ඒවා පළාත් සභාවලට ලබා නොදී ජාතික ආයතනවලින් එකතු කිරීම දක්නට ලැබේ. උදාහරණ ලෙස ඖෂධ හා රසායනික ද්‍රව්‍ය විකුණුම් මත අය කරන ගාස්තු, වෘක්ෂලතා ආරක්ෂණ නීතිය යටතේ අය කරන ගාස්තු ආදිය ජාතික

ආයතනවල රඳවා තබාගන්නා බව පෙනී යයි. එබැවින්, එකඟවූ ක්‍රමවේදයන් තුළ එම ආදායම් ජාතික ආයතන හා පළාත් ආයතන අතර බෙදා ගැනීම කළ යුතු වේ.

#### 4.4.2 පළාත් පාලන ආයතනවල ආදායම් ප්‍රවර්ධන ක්‍රමවේද

- සියලුම පළාත් පාලන ආයතන තම බල ප්‍රදේශවලට අයත් වරිපනම් බදු නිසි අයුරින් හා නිසි කාල වකවානුවට එකතු නොකරන බව නිරීක්ෂණය වේ. සමහර පළාත් පාලන ආයතන වත්කම් මත බදු අය කිරීම කිසිදු අයුරකින් සිදු නොකරන අතර, සමහර බල ප්‍රදේශවල විවිධ හේතු මත වත්කම් තකසේරු කිරීම කාලානුරූපව සිදු නොකෙරේ. බදු ගෙවීම මහජනතාවගේ සමාජමය යුතුකමක් බව තහවුරු වන පරිදි, ආරම්භයේ දී, වත්කම් මත නාම මාත්‍රික බද්දක් හෝ අයකිරීමට කටයුතු කරන ලෙස යෝජනා කෙරේ.

- ආදායම් උත්පාදනය කරනු ලැබුවත්, තම ආදායම් මත බදු නොගෙවන ව්‍යාපාර රාශියක් පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ තිබේ. එවැනි කැපී පෙනෙන ව්‍යාපාරවලට උදාහරණ ලෙස පෞද්ගලික උපකාරක පංති, පෞද්ගලික සෞඛ්‍ය සායන, ආහාර සැපයුම්හල්, රූපලාවන්‍යාගාර හා ශාරීරික සුවතා මධ්‍යස්ථාන දැක්විය හැකිය. එවැනි ව්‍යාපාර ලියාපදිංචි කිරීමට හා නියමිත බදු ගෙවීමට උනන්දු කරවීම සඳහා නීත්‍යානුකූල විධිවිධාන හඳුන්වා දිය යුතුය.

- පවත්නා සංචාරක ආකර්ශන ස්ථානවලට අත්‍යාවශ්‍ය පහසුකම් ලබාදීම තුළින් සාධාරණ අය කිරීමක් කර, එම ආදායම් යොදවා එම ස්ථාන සංවර්ධනය හා පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳව පළාත් පාලන ආයතන විමසා බැලිය යුතුය. එවැනි ස්ථාන කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා පෞද්ගලික අංශය මැදිහත් කරගැනීම වඩාත් ප්‍රායෝගික වනු ඇත.

- මාර්ග, වීදිපහන් හා පාසල් වැනි පොදු දේපල පවත්වාගෙන යෑම පළාත් පාලන ආයතනවල අයවැයට විශාල බරක් වේ. එබැවින්, මහජනතාවට ඵලදායී වන අයුරින් එවැනි පොදු සේවාවන් පවත්වාගෙන යාම සඳහා වැයවන වියදම සඳහා සිවිල් සමාජ, කැමැත්ත දක්වන පෞද්ගලික ආයතන හා ව්‍යවසායකයන්ට දායක වන ලෙස ආරාධනා කිරීමට යෝජනා කෙරේ.

- පළාත් පාලන ආයතන විසින් තම සේවාවේ ගුණාත්මක බව හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස ආදායම් තක්සේරු කිරීම සඳහා සහ ආදායම් එකතු කිරීම පිණිස නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා විද්‍යුත් මාර්ගවලින් බදු ගෙවිය හැකි ක්‍රම සැකසීම.

## 5. උප ජාතික මට්ටමේ සංවර්ධන උපායමාර්ග

පළාත් බලධාරීන් විසින් තම පළාත් තුළ යෝජිත සංවර්ධන කටයුතු වඩාත් ශක්තිමත් කිරීම හා පහසුකරලීම වැනි කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේ දී ගත යුතු පියවර සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ පහත පරිදි වේ. ඒ සමගම, එම උපායමාර්ග හා සහසම්බන්ධිත කොටසක් ලෙස පළාත් අධිකාරීන් විසින් ඔවුන්ගේ සැලසුම් හා වැඩසටහන් තුළට වර්තමාන රජය විසින් හඳුන්වාදෙන ලද යහපාලන භාවිතයන් ඇතුළත් කිරීමට ද කටයුතු කළ යුතුය.

### 5.1 ජාතික ප්‍රතිපත්ති හා අනුගත වීම

සියලුම පළාත් විසින් ඒ ඒ විෂයන්ට අදාල ජාතික ප්‍රතිපත්තිවලට සහ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ලැයිස්තුගත කර ඇති විෂයන්ට අදාලව, ඔවුන්ගේ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. ඒ තුළ ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය, අධ්‍යාපන, කෘෂිකර්මය, මාර්ග, නිවාස, කර්මාන්ත හා සංස්කෘතිය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී, මනා සම්බන්ධීකරණයක්, අදාල ජාතික මට්ටමේ ආයතන සමඟ පවත්වා ගැනීම අවශ්‍ය වේ.

පළාත් බලධාරීන් විසින් පහත දක්වා ඇති ප්‍රධාන අංශ හා සම්බන්ධ වත්මන් රජයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය මගපෙන්වීම් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

**සෞඛ්‍යය:** සෞඛ්‍යය යනු, අනාගතය සඳහා කරනු ලබන ආයෝජනයක් ලෙස සැලකේ. එහෙයින්, රජයේ රෝහල් පද්ධතිය ශක්තිමත් කිරීම මගින් රෝග නිවාරණ හා සායනික කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතරම, රෝග වළක්වා ගැනීම සම්බන්ධයෙන් ද ප්‍රමුඛතාවක් ලබාදිය යුතු වේ. තවද, රෝගීන් සඳහා ඉහළ සේවාවක් ලබාදීම සඳහා බටහිර හා දේශීය සෞඛ්‍ය අංශ ඒකාබද්ධව ක්‍රියාකිරීම ද අත්‍යවශ්‍ය වේ.

**අධ්‍යාපනය:** අධ්‍යාපනයේ දී සැමට සම අවස්ථා ලබාදීම සහතික කිරීමේ අරමුණින් මානව හා භෞතික සම්පත් පාසල් පද්ධතිය තුළ බෙදා හැරීම සඳහා අධ්‍යාපන අංශය තුළ ක්‍රියාත්මක ප්‍රතිසංස්කරණ හා සංවර්ධන වැඩසටහන් වත්මන් ආර්ථික අවශ්‍යතා අනුව ක්‍රියාත්මක කළ යුතුය. මෙම අංශය සඳහා විශාල වශයෙන් වෙන් කරනු ලබන සම්පත්, උපරිම කාර්යක්ෂමතාවකින් උපයෝජනය කිරීම සඳහා පෙර පාසල් අධ්‍යාපන ක්‍රමයේ සිට විශ්වවිද්‍යාල ක්‍රමය දක්වා ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය.

**කෘෂිකර්මය:** රසායනික පොහොර හා කෘමි නාශක භාවිතය අවම කිරීම තුළින් සෞඛ්‍යයට හිතකර ආහාර නිපදවීම සඳහා ගොවීන් දිරි ගැන්විය යුතුය. මේ සඳහා කාබනික පොහොර හා සාම්ප්‍රදායික පලිබෝධ පාලක ක්‍රම ප්‍රවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. සාම්ප්‍රදායික ආහාර පුරුදු හා භාවිතයන් ආරක්ෂා කරගැනීම අරභයා දේශීය ශාක වර්ග හා බීජ ප්‍රචලිත කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. තවද, දේශීය පරිසර තත්ත්වයන්ට ගැලපෙන නව ශාක හා බීජ වැඩිදියුණු කිරීම අරමුණු කොට ගනිමින්, කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල ධාරිතා වර්ධනය සඳහා පියවර ගත යුතුවේ.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්:** අදාල තාක්ෂණික දැනුම බෙදා හැරීම, පුහුණු ශ්‍රමය හා ව්‍යවසායකත්වය ලබාදීම, මූල්‍ය සහන සැලසීම හා වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ගොඩනැංවිය යුතුය. දේශීය හා අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින්, සාම්ප්‍රදායික භාණ්ඩ නව රටාවකින් නිපදවීමේ අරමුණ ඇතිව, හඳුනාගත් ශක්‍යතාවක් සහිත ව්‍යවසායකයන් හා ගම්මාන, කාර්මික ජනපද ලෙස සංවර්ධනය කිරීම කළ යුතුය. මෙම නිෂ්පාදන විදේශීය සංචාරකයන් ආකර්ශනය කරගැනීම සඳහා ඉහළ ගුණාත්මක බවකින් යුතු විය යුතු අතරම, ග්‍රාමීය ප්‍රජාව සඳහා අමතර ආදායම් උත්පාදන මාර්ගයක් ද විය යුතුය.

**ධීවර:** සහනදායී මිලකට ධීවර යාත්‍රා හා ධීවර ආම්පන්න සැපයීම තුළින් කුඩා පරිමාණ ධීවරයින්ගේ දැවෙන ගැටළුවලට විසඳුම් ලබාදීමට කටයුතු කළ යුතුය. ධීවරයන්ට, ධීවර උපකරණ අවම මිලක් යටතේ මිලට ගැනීමට හැකි වන ආකාරයට එම උපකරණ මත පනවා ඇති බදු ඉවත් කිරීමට රජය විසින් යෝජනා කර ඇත.

**නිවාස:** 'සැමට සෙවණ' යන ඉලක්කය සපුරා ගැනීම සඳහා අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස ඉදිකිරීමට හා වැඩිදියුණු කිරීමට සහය ලබාදිය යුතුය. සම්පූර්ණයෙන්ම ආපසු නොගෙවිය යුතු ප්‍රදාන ලබාදීම වෙනුවට, අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී "ස්වයං ආධාරක" ක්‍රමවේදය අනුගමනය කළ යුතුය. චක්‍රීය අරමුදල් තුළින් නිවාස ආධාර ක්‍රියාත්මක කරනු වෙනුවට ග්‍රාමීය බැංකු මගින් සහන පදනම මත නිවාස ණය ලබාදීමේ සේවාව සිදු කිරීමට යෝජනා කෙරේ.

### 5.2 ග්‍රාමීය ජීවනෝපාය වැඩිදියුණු කිරීම

සංචාරක, කෘෂිකර්ම, පශු සම්පත් හා ග්‍රාමීය කර්මාන්ත ආදී කටයුතුවල යෙදී සිටින ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිරිගැන්විය යුතුය. ප්‍රජාව සඳහා රැකියා අවස්ථා උත්පාදනය කිරීමේ අරමුණ ඇතිව ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා පෞද්ගලික අංශයට ආරාධනා කළ යුතුය. ඒ සඳහා පළාත් බලධාරීන් විසින් අවශ්‍ය යටිතල පහසුකම් සහ අනෙකුත් යෙදවුම් සැපයීම සිදු කළ යුතුය. සහනදායී මූල්‍ය පහසුකම් වෙළඳපොළ ප්‍රවේශය, සුදුසු තාක්ෂණික ශිල්ප ක්‍රම හා ව්‍යවසායකත්ව සංවර්ධනය වැනි ක්‍රියා මාර්ග මගින් ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය සිදු කළ යුතුය.

### 5.3 මාර්ග සම්බන්ධතා සංවර්ධනය

මහා මාර්ග හා අධිවේගී මාර්ග වෙත සම්බන්ධ වන ප්‍රවේශ මාර්ග බොහොමයක් නඩත්තු කරනුයේ පළාත් විසිනි. එසේ හෙයින්, පළාත් ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන පළාත් මාර්ග ජාලය සංවර්ධනය හා ප්‍රතිසංස්කරණ කිරීම පළාත් බලධාරීන්ගේ ප්‍රධාන භූමිකාවක් වේ. මෙහිදී, පහත කරුණු පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

- මාර්ග පද්ධතිය පරිගණකගත කිරීම හා ගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.
- මාර්ග වැඩිදියුණු කිරීම හා ගුණාත්මකව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් පරිදි සම්පත් වෙන් කිරීම.
- ඉදිකිරීම්වල ගුණාත්මකභාවය තහවුරු වන පරිදි ඒ ඒ මාර්ග නඩත්තු කිරීමේ වගකීම අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා එය ඉදි කළ කොන්ත්‍රාත්කරුට පැවරිය යුතුය.
- ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන්, කොන්ත්‍රාත්කරුවන් හා කම්කරුවන් ආදී පුහුණු ශ්‍රම සම්පත අවශ්‍ය ප්‍රමාණයට සැපයීම තහවුරු කිරීම.
- සුදුසු තාක්ෂණ ක්‍රමවේද හා අඩු වියදම් සැලසුම් සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- අවිධිමත් ඉදිකිරීම් වැළැක්වීම සඳහා ජලය, විදුලිය හා විදුලි සංදේශ වැනි අනෙකුත් සේවා සපයන අංශ සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.
- ඉඩම් අත්පත්කර ගැනීම, තාක්ෂණ විගණනය, පරිසර සංරක්ෂණය හා නඩත්තුව පිළිබඳ සුදුසු මාර්ගෝපදේශ සැකසීම.

### 5.4 අඩු ආදායම්ලාභී පවුල් සඳහා අවම සුභසාධනය තහවුරු කිරීම

ජාතික මට්ටමේ දී, ඒක පුද්ගල ආදායම, දරිද්‍රතාවය, සාක්ෂරතාව හා සෞඛ්‍ය තත්ත්වය ආදියේ ප්‍රශංසනීය ජයග්‍රහනයක් ප්‍රදර්ශනය වුවද, විවිධ ආදායම් කණ්ඩායම් අතර තියුණු ආර්ථික-සමාජයීය විෂමතා නිරීක්ෂණය

වේ. අංශ කිහිපයක හැරුණු විට, සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ යටතට ගැනෙන බොහෝ දර්ශක වලදී මෙම විෂමතාවය ඉතා පැහැදිලිව පෙන්නුම් කෙරේ. එමනිසා, සැලසුම් හා ව්‍යාපෘති සකස් කිරීමේ දී, පළාත් බලධාරීන් විසින් එලෙස පසුබෑමට ලක්වූ ප්‍රදේශ පිළිබඳ තම විශේෂ අවධානය යොමු කළ යුතුය. එබැවින්, ව්‍යාපෘති හා වැඩසටහන් පිළියෙල කිරීමේ දී, අඩු ආදායම්ලාභී පවුල් කෙරෙහි අවධානය යොමු කිරීම පළාත් බලධාරීන්ගෙන් අපේක්ෂා කෙරේ.

### 5.5 පසුගාමී ප්‍රදේශ සඳහා විශේෂ අවධානය

පළාත්වල සමාජ-ආර්ථික සංවර්ධනය සලකා බැලූ විට පළාත් තුළ ප්‍රාදේශීය විෂමතා පවතින බව නිරීක්ෂණය වේ. සම්පත්, සේවාවන් සහ වෙළඳපොළ සඳහා නිසි පරිදි ප්‍රවේශයන් නොමැති භූගෝලීය වශයෙන් හුදෙකලා වූ ප්‍රදේශ දක්නට ලැබේ. හුදෙකලා හා පසුගාමී ගම්මාන සංවර්ධනය කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් වෙන් කළ විශේෂ ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදවා එවැනි අසමතුලිතතාවයන් අඩු කරලීම තුළින් එම පළාත්වල සෑම පුරවැසියෙකුටම අවම සුභසාධනය සහතික කරලීමට හැකි වන පරිදි කටයුතු කළ යුතු වේ.

### 5.6 දින සියයේ වැඩසටහන

යෝජිත සය අවුරුදු සංවර්ධන වැඩසටහනට ඇතුළත් හදිසි අවශ්‍යතා ආවරණය වන ලෙස වත්මන් රජය විසින් 2015 වසරේ මුල් මාස හතර සඳහා ‘දින සියයේ වැඩසටහනක්’ එළිදක්වා ඇත. එම වැඩසටහන අනුව, තම වාර්ෂික සැලසුම් සකස් විය යුතු බවට මුදල් කොමිෂන් සභාව විසින් එක් එක් පළාත් වෙත දැනටමත් උපදෙස් ලබාදී ඇත.

පළාත් සංවර්ධන සැලසුම් සංශෝධනය කිරීමේ දී, වත්මන් රජය විසින් හඳුන්වාදෙන ලද දින සියයේ වැඩසටහනට ඇතුළත් පහත දැක්වෙන ප්‍රධාන කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

- යෝග්‍ය දිරිගැන්වීම් ලබාදීම තුළින් පෞද්ගලික හා රාජ්‍ය ප්‍රවාහන සේවාවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- මිනිස් ජීවිතවලට මෙන්ම පසටද අහිතකර, අඩු ගුණත්වයකින් යුත් පොහොර භාවිතය වෙනුවට ඉහළ ගුණත්වයෙන් යුත් පොහොර භාවිතය තුළින් නිසි ප්‍රමිතීන් තහවුරු කිරීම.
- නොමිලේ අන්තර්ජාල ප්‍රවේශය සඳහා සෑම නගරයකම මධ්‍යස්ථාන පිහිටුවීම.
- ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු වැඩිදියුණු කිරීමට හා නියාමනයට ආයතනයක් ස්ථාපිත කිරීම.
- සුළු පරිමාණ කර්මාන්ත ආරක්ෂා කරගැනීම සඳහා කාර්යංශයක් පිහිටුවීම.
- රජයේ රෝහල්වලට ඇතුළත් වන රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව ලබාගත හැකි වන ලෙසට සුලභ කිරීම.
- බාහිර රෝගී ප්‍රතිකාර සඳහා රජයේ රෝහල් රාත්‍රී 10.00 වන තෙක් විවෘතව තැබීම.
- ආයුර්වේද වෛද්‍ය සේවය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- බටහිර, පෙරදිග හා දේශීය වෛද්‍ය සේවා කාර්යක්ෂමව සම්බන්ධීකරණය කිරීම තුළින් මහජනතාවට වඩා හොඳ සේවාවක් ලබාදීමට කටයුතු කිරීම.
- නිදහස් අධ්‍යාපනය සඳහා දැනට වෙන් කරනු ලබන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.7% ක ප්‍රමාණයකි. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% දක්වා ක්‍රමිකව ඉහළ දැමීම.

- ධීවර යාත්‍රා, දැල්, ධීවර ආම්පන්න හා එංජින් මත දැනට අය කරනු ලබන ඉහළ බදු අනුපාත ඉවත් කිරීම.
- හානියට පත් වී ඇති වාරිමාර්ග අලුත්වැඩියාව සඳහා කඩිනම් පියවර ගැනීම.
- ජලාශවල පිරී ඇති රොන් මඩ ඉවත් කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම.
- නිවාස නොමැති ලක්ෂයක් ජනතාව සඳහා නිවාස ඉදිකර දීමේ කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- කලාකරුවන්ගේ ස්වාධීනත්වය මෙන්ම ඔවුන්ට ප්‍රමාණවත් ආරක්ෂණයක් සැපයෙන සංස්කෘතියක් ඇති කිරීම.

### 5.7 දින සියයේ විප්ලවය - ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශය

ගරු මුදල් අමාත්‍යතුමා විසින් "දින සියයේ වැඩසටහන" ලෙස නම් කරන ලද මූල්‍ය ප්‍රකාශය 2015 ජනවාරි මස 29 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම ප්‍රකාශනය ජනතාවට කඩිනම් සහන සැලසීමේ අරමුණින් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද දින සියයේ වැඩසටහන සමග සමපාත වේ. දින සියයේ වැඩසටහන පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ දී, ඉහත ප්‍රකාශනයේ අන්තර්ගත ඇතැම් යෝජනා අදාල කරගත හැකිය. ඒවා සංක්ෂිප්තව පහත දැක්වේ.

- 2015 මහ කන්නයේ සිට වී කිලෝ ග්‍රෑමයක් මිලදී ගැනීමේ සහතික මිල රු. 50/- දක්වා ඉහළ දැමීම.
- මීළඟ කන්නයේ සිට අර්තාපල් කිලෝ ග්‍රෑමයක් මිලට ගැනීමේ සහතික මිල රු. 80/- දක්වා ඉහළ දැමීම.
- තේ දළු කිලෝ ග්‍රෑමයක් මිලට ගැනීමේ සහතික මිල රු. 80/- දක්වා ඉහළ දැමීම.
- රබර් කිලෝ ග්‍රෑමයක් මිලට ගැනීමේ සහතික මිල රු. 350/- දක්වා ඉහළ දැමීම.
- 2015 ජූලි සිට නැවුම් දියර කිරි ලීටර් එකක් මිලට ගැනීමේ සහතික මිල රු. 70/- දක්වා ඉහළ දැමීම.
- පසුගාමී ප්‍රදේශවල ආයෝජනය කරනු ලබන ආයෝජකයන්ගේ ලාභයෙන් අයකරන බද්ද, සාමාන්‍ය ආදායම් බද්දෙන් 50% ක් දක්වා අඩු කිරීම.
- ග්‍රාමීය ප්‍රදේශවල මූල්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සමෘද්ධි / දිවි නැගුම බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඒකාබද්ධ කිරීම.
- වසර හතක් හෝ ඊට අඩු කාලයක දී ආයෝජනය කරන ලද ප්‍රාග්ධනයට ප්‍රතිලාභ උත්පාදනය කරනු ලබන සූර්ය පැනල, ඒ සඳහා යෝග්‍ය ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමට කටයුතු කිරීම තුළින් විදුලි වියදම් අවම කරගැනීම.

### 5.8 ඵලදායී මෙහෙයුම් හා ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම

2015 වර්ෂයේ දී, සියලුම පළාත් සඳහා ආයතනික ප්‍රතිඵල රාමුව මත පදනම්ව මෙහෙයුම් හා ඇගයුම් පද්ධතියක් ස්ථාපනය කිරීමට නිර්දේශ කෙරේ. මෙම ප්‍රවේශයේ දී, පළාත් මට්ටමේ ආයතන විසින් වසර 05 ක් සඳහා නියම කර ගත් ප්‍රමුඛ පරාස, මූලික කාර්ය සාධක දර්ශක හා ඉලක්ක මත පදනම්ව අපේක්ෂිත නිමැවුම් හා ප්‍රතිඵල හඳුනා ගැනීම අපේක්ෂා කෙරේ. එහිදී, හුදු යෙදවුම් හා නිමැවුම් මත පදනම් වන සාම්ප්‍රදායික ක්‍රියා පටිපාටියෙන් බැහැරව, සම්පත් ඵලදායීව උපයෝජනය කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට

අපේක්ෂා කෙරේ. ප්‍රතිඵල පාදක ඇගයීම් හා අධීක්ෂණ ක්‍රියාවලියට සහය දීම සඳහා, මේ වන විටත් මුදල් කොමිෂන් සභාව විසින් හඳුන්වාදී ඇති ආකෘති පත්‍රය පසුගිය කාලය තුළ ලබාගත් අත්දැකීම් සැලකිල්ලට ගනිමින් සංශෝධනය කිරීමට අපේක්ෂා කෙරේ.

### 5.9 පළාත්වල කාර්යමණ්ඩල අවශ්‍යතා තක්සේරුව

අයවැය මත අතිරේක බරක් ඇතිකරවන ඵලදායී නොවන සේවක පිරිසක් නිර්මාණයවීම වැළැක්වීම සඳහා රාජ්‍ය ආයතන විසින් තමන් වෙත පැවරී ඇති කාර්යභාරය හා සේවා සැපයීම පිළිබඳව මනා ඇගයීමක් කළ යුතුය. මෙම අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැටුප් කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව ආදී ප්‍රධාන ආයතන විසින් කාර්ය මණ්ඩල පිළිබඳ කාලීන සමාලෝචනයන් සිදු කිරීම අවශ්‍ය වේ.

### 5.10 බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම

ලොකු ළූණු, අර්තාපල් හා බෝංචි බීජ ගොවීන්හට දේශීය බීජ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ශක්‍යතාවයක් ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර, ඒ තුළින් බීජ ආනයනය සඳහා වැය වන විදේශ විනිමය ඉතිරි කරගැනීමේ හැකියාව පවතී. මේ පසුබිම යටතේ, බීජ නිපදවනු ලබන පළාත්වල අධිකාරීන් විසින් සහනදායී ණය සැපයීම, තාක්ෂණික දැනුම ලබාදීම, ව්‍යවසායකත්ව කුසලතා ප්‍රවර්ධනය, ගබඩා පහසුකම් සැපයීම හා අනෙකුත් අදාල අවශ්‍යතා සැපයීම හරහා බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමට පියවර ගත යුතුය. මෙම ජාතික වැදගත්කමකින් යුත් ගැටළුව පිළිබඳ පුළුල් අධ්‍යයනයක් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් මහ බැංකුව සමග මේ වන විටත් පුළුල් සංවාදයක් පවත්වාගෙන යනු ලබන අතර, එම අධ්‍යයනයෙන් හඳුනාගනු ලබන යෝජනා ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂා කෙරේ. එමෙන්ම, බීජ ආනයනය මත අය කරනු ලබන තීරු බදු පිළිබඳව මහා භාණ්ඩාගාරය විසින් නව ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බවට මුදල් කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

## 6. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් කරා

ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රධාන අරමුණ වනුයේ, ආර්ථික හා සමාජ සංවර්ධනයට අදාල ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සහ රටෙහි අනෙකුත් ප්‍රදේශවලට සමාන වන පරිදි නොදියුණු ප්‍රදේශවල සංවර්ධන මට්ටම ඉහළ නැංවීමයි. රටක ආර්ථික ක්‍රියාකාරකම් යම් විශේෂිත ප්‍රදේශයක හෝ ප්‍රදේශවල ඒකරාශී වීමට ඇති ස්වභාවික ප්‍රවණතාවය හේතුවෙන් ඕනෑම රටක දක්නට ලැබෙන සමාජ ආර්ථික සංවර්ධනයෙහි ප්‍රාදේශීය විෂමතාවන් මුළුමනින්ම දුරලීම කිසිසේත් සිදු කළ නොහැක. අගනගර ප්‍රදේශවල හා නාගරික ප්‍රදේශ වටා කර්මාන්ත හා සේවාවන්හි ඒකරාශී වීම ඉතා දියුණු රටවල පවා පැහැදිලිව දැකිය හැකි ලක්ෂණයකි. මෙයට හේතුව එකී ප්‍රදේශ විසින් භුක්ති විඳිනු ලබන පරිමාණානුකූල ආර්ථික වාසි පිළිබඳ තත්ත්වයයි. මෙම සන්දර්භය තුළ ප්‍රාදේශීය සංවර්ධනයට අදාල මගහැරවිය නොහැකි විෂමතාවයන් නිසැකයෙන්ම හටගැනේ.

මෙම අහිතකර ප්‍රවණතාවය අවම කරලීම සඳහා ස්වකීය සංවර්ධන මට්ටම සැලකිල්ලට නොගෙන, සියලුම රාජ්‍යයන් විසින් නිසි මැදිහත්වීම මගින් රාජ්‍ය හා පෞද්ගලික සම්පත් ඌණ සංවර්ධිත ප්‍රදේශවලට යොමු කරවීම පිණිස නිසි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. රැකියා අවස්ථා නිර්මාණය කිරීමේ හා ප්‍රාදේශීය දිළිඳු භාවය අවම කිරීමේ අරමුණින්, වත්මන් රජය විසින් ඌණ සංවර්ධිත ප්‍රදේශ කරා යොමු වීමට කැමැත්තක් ඇති

ආයෝජකයින් දිරි ගැන්වීමේ වැඩ පිළිවෙලක් යෝජනා කර ඇති බව සඳහන් කළ යුතුය. ඒ අනුව, මෙබඳු ආයෝජකයින් උපයන ලාභයෙන් අයවිය යුතු බදු මුදල ආදායම් බද්දෙන් 50% ක් දක්වා අඩු කිරීමට යෝජනා කර ඇත. ( දින 100 වැඩ පිළිවෙල - ගරු මුදල් අමාත්‍යතුමාගේ මුල්‍ය ප්‍රකාශය - 2015)

භෞතික හා මානව සම්පත් යන දෙඅංශයෙහිම තමන් සතුව ඇති සාපේක්ෂ වාසි සැලකිල්ලට ගෙන ස්වකීය පළාත් තුළ ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් පළාත් සභා මගින් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. සියලුම සම්පත් උපරිම ලෙස භාවිතයේ යෙදෙන පරිදි ස්වකීය සංවර්ධන සැලසුම් පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් සැකසීම සිදු කළ යුතුය. තුලිත ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කරමින් සැලසුම් අනුමත කිරීමේදී මෙන්ම, සම්පත් යෙදවීමේදී ද, ස්වකීය ආයතනික වගකීමට අනුව වඩාත් සාධාරණ හා විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීමට මුදල් කොමිෂන් සභාව සහතික වනු ඇත. එසේම විකල්ප මූල්‍යකරණ ක්‍රමවේද සලකා බැලීමේ දී, පෞද්ගලික හා රාජ්‍ය සහභාගිත්වය, කළමණාකරණ ගිවිසුම් වැනි දේ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සපයනු ඇත. මෙම පරිච්ඡේදයේ ඊළඟ කොටස යොමු වන්නේ පසුගිය කාලය තුළ සමාජ ආර්ථික විෂමතාවය අවම කිරීමේ අරමුණ සැලකිය යුතු මට්ටමකින් සාක්ෂාත් කරගෙන ඇත්දැයි විමසා බැලීම සඳහා වේ. මෙහිදී, සංවර්ධන ප්‍රතිඵල මත සිදුවූ වෙනස්කම් මැන බැලීම සඳහා වගු අංක 23 හි දැක්වෙන හඳුනාගත් සමාජ-ආර්ථික දර්ශක කිහිපයක් භාවිතා කරනු ඇත.

මුදල් කොමිෂන් සභාවේ ප්‍රමුඛතම වගකීම වන්නේ, වඩා තාර්කික ආකාරයෙන් පළාත් අතර සම්පත් වෙන් කිරීම තුළින් රට තුළ ප්‍රාදේශීය විෂමතා අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඔවුන් යොමු කරලීමයි. මෙම ක්‍රියාවලියේ දී, පළාත් අතර අරමුදල් බෙදා හැරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් සංඛ්‍යානමය ක්‍රමවේදයක් භාවිතයට ගනී. තවද, මෙහිදී විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ එක් එක් පළාතට සුවිශේෂී වූ පිහිටීමට අදාල අවාසිසහගත තත්ත්වයන් වැනි ප්‍රායෝගික කරුණු සැලකිල්ලට ගැනේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව, පළාත් සභා වෙත බලය විමධ්‍ය ගත කිරීම ප්‍රතිපත්තියක් ලෙස වර්තමාන රජය විසින් පිළිගෙන ඇත. උතුරු හා නැගෙනහිර පළාත් සඳහා නව ආණ්ඩුකාරවරුන් පත්කිරීම තුළින් පළාත් සභා සමග සමීප සබඳතාවයකින් කටයුතු කිරීමේ රජයේ අභිප්‍රාය පැහැදිලි වේ. අතිගරු ජනාධිපතිතුමා විසින් සිදු කිරීමට අපේක්ෂිත දේශපාලන ප්‍රතිසංස්කරණ සහ යෝජිත සංවර්ධන යෝජනාක්‍රම පිළිබඳව ඔවුන්ගේ සහාය රජයට ලබාදීමට උතුරු හා නැගෙනහිර පළාත්වල දේශපාලන නායකත්වය විසින් ප්‍රතිඥා දීම තුළින් රජය හා පළාත් සභා අතර සුහද සබඳතාවය පැහැදිලිව පෙනී යයි. ජාත්‍යන්තර ප්‍රජාව මෙම ක්‍රියාවලිය සඳහා සහයෝගය පළ කර තිබෙන අතර, එය රජය හා පළාත් අතර පවත්නා සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පූර්ව සාධකයක් වනු ඇත. තවද, එක් එක් දේශපාලන පක්ෂවල විවිධ දේශපාලන මතවාද හා විවිධ ප්‍රජාවන්ගේ නියෝජනය සැලකිල්ලට නොගෙන නැගෙනහිර පළාතේ ඒකාබද්ධ පරිපාලන ව්‍යුහයක් සැකසීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත.

පළාත් සභාවන්හි වාර්ෂික සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් විශේෂයෙන්ම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා විවිධ මූලාශ්‍රවලින් අරමුදල් ලැබේ. මේ අතරින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක සංවර්ධන ප්‍රදාන හා සාමූහික ප්‍රදාන වෙනුවෙන් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය මත ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපාදන වෙනුකරනු ලැබේ. එමෙන්ම, නිල විදේශ ආධාර සපයනු ලබන ද්විපාර්ශවික හා බහු පාර්ශ්වික ආයතන මගින් මුළු අරමුදල් ප්‍රවාහයෙන් 60% ක පමණ ප්‍රමාණයක් සපයනු ලබයි. පළාත් සභාවන්හි පුනරාවර්තන වියදම් වලින් සැලකිය යුතු කොටසක්, පළාත් සභා වෙත විමධ්‍යගත වූ විෂයන් යටතේ

එක් රැස් කර ගනු ලබන ආදායම් වලින් මෙන්ම මධ්‍යම රජය සමග පවතින ආදායම් හුවමාරු කර ගැනීමේ ගිවිසුම් යටතේ ලැබෙන අරමුදල් මගින් පියවාගනු ලැබේ.

2011-2015 දක්වා කාලය තුළ මුදල් කොමිෂන් සභාව මගින් විවිධ ප්‍රභවයන් ඔස්සේ පළාත් සභා වෙත වෙන් කළ මුදල් ප්‍රමාණයන් පහත වගුව 22 මගින් දැක්වේ.

**වගුව 22: සම්පත් මූලාශ්‍රය අනුව පළාත් මට්ටමෙන් ප්‍රතිපාදන වෙන් කිරීම - (2011-2015)**

**(රු.මි.)**

| මූලාශ්‍රය | වසර | | | | | | වැඩිවීමේ ප්‍රතිශතය 2011-2015 |
|---|---|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2014** | **2015** | **Total** | |
| සාමූහික ප්‍රදාන | 90,000 | 94,877 | 102,800 | 112,594 | 189,600 | 589,871 | 110 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 11,365 | 12,875 | 10,180 | 10,205 | 12,007 | 56,632 | 6 |
| උපමාන පාදක ප්‍රදාන | 2,835 | 3,025 | 2,390 | 3,270 | 3,785 | 15,305 | 33 |
| දේශීය විදේශ ආධාර මත පදනම් වූ සංවර්ධන ව්‍යාපෘති | 12,092 | 11,839 | 14,384 | 18,995 | 18,425 | 75,735 | 52 |
| **එකතුව** | **116,292** | **122,616** | **129,754** | **145,064** | **223,817** | **737,543** | **92** |

*මූලාශ්‍රය :- මුදල් කොමිෂන් සභාව*

2011 සිට 2015 දක්වා වූ වසර 05 ක කාලය තුළ පළාත් සභාවන්හි පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා රු.මි. 737,543 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. මුදල් කොමිෂන් සභාවේ අනුදැනුමකින් තොරව රේඛීය අමාත්‍යාංශ හා මහා භාණ්ඩාගාරය මගින් පළාත් සභාවලට වෙන් කරන ලද සමහර ප්‍රතිපාදන මෙහි අඩංගු නොවන බව සැලකිය යුතු වේ.

පළාත් සභාවන් වෙත විවිධ ප්‍රභවයන් ඔස්සේ වෙන් කරන ලද රු.මි. 737,543 ක මුදලින් 80% ක ප්‍රමාණයක් වැය වන්නේ, වැටුප් හා අනෙකුත් පුනරාවර්තන වියදම් වෙනුවෙනි. ජාතික මට්ටමේ අමාත්‍යාංශ හා ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා පළාත් කාර්ය මණ්ඩලවල සක්‍රීය සහභාගීත්වය මෙහිලා සඳහන් කිරීම වැදගත්ය. විශේෂයෙන්ම අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලයේ දායකත්වය මෙහිලා අගය කළ යුතුය. අදාල කාලය පරිච්ඡේදය තුළ පවත්නා මිල යටතේ වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන

ප්‍රමාණය 92% කින් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ. රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් හා රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම නිසා පුනරාවර්තන වියදම් 110% කින් පමණ වැඩිවී ඇත.

පසුගිය කාලය තුළ පළාත්වලට ප්‍රතිපාදන වෙන් කිරීමේ ප්‍රවණතාවය නිරීක්ෂණය කරන විට, රජයේ සමස්ත ප්‍රාග්ධන වියදමින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය මත යොමු කරන ප්‍රමාණය 2% කට ආසන්න බව පෙනේ. එසේ වුවත්, මුදල් කොමිෂන් සභාව විසින් මහජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි වඩා ඵලදායී ලෙස මෙම අරමුදල් ආයෝජනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ පළාත් සභා වෙත ලබාදෙනු ඇත.

ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය අනුව, දැනට ක්‍රියාත්මක පළාත් සැලසුම් ක්‍රියාවලිය තුළින් මැනිය හැකි දර්ශක මගින් මැනිය හැකි ප්‍රතිඵල ළඟා කරගැනීමට අපේක්ෂා කෙරේ. පළාත්වල සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල ආයෝජන දිරිගැන්වීමේ දී, පෞද්ගලික අංශය සමග සමීපව ක්‍රියා කිරීම පළාත්වලින් අපේක්ෂා කෙරේ. මේ අනුව, සමාජීය වගකීමක් සහිත පෞද්ගලික අංශය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී, පාර්ශවකරුවෙකු ලෙස ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ.

### 6.1 පළාත් ආර්ථික හා සාමාජයීය විෂමතා

වගු අංක 23 තුළ දළ ජාතික නිෂ්පාදිතය, දරිද්‍රතාවය හා ආදායම, සේවා වියුක්තිය, සෞඛ්‍යය, අධ්‍යාපනය හා යටිතල පහසුකම් යන ක්ෂේත්‍රවල මූලික සමාජ ආර්ථික දර්ශක අඩංගු තොරතුරු දැක්වේ.

## වගුව 23: පළාත් අනුව මූලික සමාජ - ආර්ථික දත්ත

| අංශය / ක්ෂේත්‍රය | දර්ශකය | පළාත | | | | | | | | | | ශ්‍රී ලංකාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වසර | බස්නාහිර | මධ්‍යම | දකුණු | උතුරු | නැගෙනහිර | වයඹ | උතුරු මැද | ඌව | සබරගමුව | |
| දළ දේශීය නිෂ්පාදිතය | පළාත් දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල අනුව (රු.මි.) | 2010 | 2,512,908 | 562,744 | 598,976 | 189,740 | 333,969 | 534,831 | 266,954 | 253,177 | 350,806 | 5,604,105 |
| | | 2013 | 3,643,180 | 959,694 | 954,568 | 311,468 | 542,845 | 886,819 | 438,862 | 409,979 | 526,185 | 8,673,870 |
| | පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතය | 2010 | 44.8 | 10.0 | 10.7 | 3.4 | 6.0 | 9.5 | 4.8 | 4.5 | 6.3 | 100.0 |
| | | 2013 | 42.0 | 11.1 | 11.0 | 3.6 | 6.3 | 10.2 | 5.1 | 4.7 | 6.1 | 100.0 |
| | ඒක පුද්ගල ආදායම (රු.දහස්) | 2011 | 489 | 237 | 285 | 202 | 239 | 277 | 244 | 222 | 207 | 314 |
| | | 2012 | 564 | 289 | 353 | 288 | 304 | 307 | 281 | 271 | 243 | 373 |
| | ඒක පුද්ගල ආදායම අනුපාතය** | 2011 | 1.6 | 0.8 | 0.9 | 0.6 | 0.8 | 0.9 | 0.8 | 0.7 | 0.7 | 1.0 |
| | | 2012 | 1.5 | 0.8 | 0.9 | 0.8 | 0.8 | 0.8 | 0.8 | 0.7 | 0.7 | 1.0 |
| දරිද්‍රතාවය හා ආදායම | දරිද්‍රතා අනුපාතය | 2009/2010 | 4.2 | 9.7 | 9.8 | 12.8 | 14.8 | 11.3 | 5.7 | 13.7 | 10.6 | 8.9 |
| | ගෘහ ඒකක ආදායමේ ගිනි සංගුණකය | 2009/2010 | 0.45 | 0.51 | 0.45 | * | 0.33 | 0.49 | 0.39 | 0.41 | 0.5 | 0.49 |
| | | 2012/2013 | 0.48 | 0.42 | 0.47 | 0.54 | 0.42 | 0.52 | 0.39 | 0.51 | 0.41 | 0.48 |
| විරැකියාව | විරැකියා අනුපාතය | 2010 | 3.7 | 6.7 | 7.8 | * | 5.3 | 4.8 | 3.6 | 4.1 | 4.6 | 4.9 |
| | | 2013 | 3.9 | 4.6 | 5.6 | 5.2 | 4.3 | 3.7 | 3.3 | 3.2 | 5.8 | 4.4 |
| සෞඛ්‍යය | මාතෘ මරණ අනුපාතය | 1990/91 | 17.8 | 81.4 | 28.9 | 37.9 | 70.2 | 41.4 | 44.3 | 37.8 | 52 | 42.3 |
| | | 2009 | 4 | 9.5 | 4.4 | 4 | 14.5 | 16.8 | 8.4 | * | 6.1 | 7.4 |
| | ළදරු මරණ අනුපාතය | 1990/91 | 20.7 | 24.9 | 15.1 | 8.5 | 9.3 | 19.2 | 16.6 | 11.9 | 19.8 | 17.7 |
| | | 2009 | 10.71 | 11.6 | 9.01 | 16.21 | 7.99 | 8.46 | 10.88 | 5.78 | 6.7 | 9.7 |
| යටිතල පහසුකම් | විදුලිබල පහසුකම් සහිත ගෘහ ඒකක ප්‍රතිශතය | 2006/2007 | 92.8 | 78.2 | 84.4 | * | 68 | 70.7 | 69.1 | 69.2 | 71.3 | 80.0 |
| | | 2009/2010 | 95 | 87.3 | 91.1 | 69.6 | 76.3 | 77 | 77.2 | 78.9 | 79.1 | 85.3 |
| | ආරක්ෂිත පානීය ජල පහසුකම් සහිත ගෘහ ඒකක ප්‍රතිශතය | 2009/2010 | 95.7 | 81.2 | 86.2 | 96.2 | 96 | 91.4 | 91.7 | 69.9 | 70.4 | 87.7 |
| අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සිසු ප්‍රතිශතය | 2010 | 59.2 | 59.3 | 63.47 | 66.77 | 63.1 | 63.48 | 60.09 | 60.86 | 63.95 | 61.47 |
| | | 2013 | 57.3 | 56.7 | 59.8 | 63.9 | 60.7 | 56.5 | 56.0 | 59.2 | 61.2 | 58.6 |
| | පරිගණක භාවිතා කළ හැකි ජනගහනයේ ප්‍රතිශතය (වයස අවු. 10 ට වැඩි) | 2012 | 32.9 | 24.1 | 22.4 | 19.4 | 18.6 | 20.5 | 17.7 | 17.6 | 19.9 | 24.2 |
| සෞභාග්‍යතා දර්ශකය | | 2009 | 72.2 | 54.5 | 56.8 | 48.9 | 50 | 53.3 | 50.9 | 50.9 | 51.8 | 56.5 |
| | | 2012 | 73.5 | 56.7 | 57.8 | 51.8 | 53.3 | 55.1 | 53 | 52.6 | 53.9 | 58.2 |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව*

*සටහන:* දත්ත නොමැත*

***පළාත් ඒක පුද්ගල ආදායම ජාතික ඒකපුද්ගල ආදායමේ ප්‍රතිශතයක් ලෙස*

පසුගිය වර්ෂ 03 ක කාලය සලකා බලන විට, වසර කිහිපයක් තුළ 45% ක් ව තිබූ බස්නාහිර පළාතේ දළ ජාතික නිෂ්පාදිතය, රටෙහි දළ ජාතික නිෂ්පාදිතයට දක්වන වටිනාකමේ ප්‍රතිශතය 44.8% සිට 42% දක්වා පිළිවෙලින් අඩුවී ඇත. සබරගමුව පළාත හැරුනු විට අනෙකුත් සියලුම පළාත් මෙම ප්‍රතිශතය සම්බන්ධයෙන් 1.1% - 0.2% අතර පරාසයක මඳ වර්ධනයක් පෙන්නුම් කරයි. ඒක පුද්ගල ආදායම් පිළිවෙලින් 2011 වර්ෂයේ සිට 2012 දක්වා කාලය තුළ රු. 314,000/- සිට රු. 373,000/- දක්වා 19% කින් වැඩි වී ඇත. මේ හා සමානවම සියලුම පළාත්වල ඒක පුද්ගල ආදායම 11% සිට 43% අතර පරාසයකින් වැඩි වීමක් දක්නට ඇත. 2011 සිට 2012 දක්වා කාලය තුළ ඒක පුද්ගල ආදායමේ ඉහළම අගය උතුරු පළාතෙහි දක්නට ලැබේ. බස්නාහිර පළාත හැරුණුවිට අනෙකුත් සියලුම පළාත් මෙහිදී ජාතික අගයට වඩා අඩු අගයක් පෙන්නුම් කරයි. 2011 වර්ෂයේදී 1.6 ක්ව පැවති බස්නාහිර පළාතේ ඒක පුද්ගල ආදායම් අනුපාතය, 2012 වන විට 1.5 දක්වා අඩු වී ඇත. උතුරු පළාතේ මෙම අනුපාතය 0.6 සිට 0.8 දක්වා වැඩි වී ඇති අතර, අනෙකුත් පළාත්වල සැලකිය යුතු වෙනසක් දක්නට නොමැත.

පසුගිය දශක දෙකක කාලය සලකා බලන විට ජාතික මට්ටමේ දරිද්‍රතා අනුපාතයෙහි සීඝ්‍ර අඩු වීමක් දක්නට ලැබේ. 1982 වර්ෂයේ 26 ක් වූ එම අගය 2010 වර්ෂයේ 8.9 දක්වා අඩු වී ඇති අතර, සහස්‍ර සංවර්ධන අරමුණු සඳහා වූ ඉලක්කය ද ඉක්මවා ගොස් ඇත. මෙම අඩුවීම සෑම පළාතකම දැකිය හැකි ලක්ෂණයක් වුවත්, පළාත් අතර මේ සම්බන්ධයෙන් සැලකිය යුතු විෂමතාවයන් නිරීක්ෂණය වේ. දරිද්‍රතා අනුපාත විෂයෙහි බස්නාහිර පළාත 4.2 ක අඩුම අගය පෙන්වන විට, නැගෙනහිර පළාතේ වැඩිම අනුපාතය එනම්, 14.8 ක් දක්නට ලැබේ. 2009 / 2011 කාලය තුළ බස්නාහිර හා උතුරු මැද පළාත් හැරුණු විට අනිකුත් පළාත්වල, ජාතික අගය වන 8.9 වඩා අඩු අනුපාතයක් දක්නට ලැබේ.

2012 / 2013 කාල සීමාව තුළ ආදායම් ව්‍යාප්ති රටාව පෙන්වන ‘ගිනි සංගුණකයෙහි’ ජාතික මට්ටමේ අගය 0.48 කි. උතුරු මැද පළාත තුළ එහි අවම අගය වන 0.39 වාර්තා වන අතර, උතුරු පළාත තුළ ඉහළම අගය වන 0.54 දක්නට ලැබේ.

විරැකියා අනුපාතය සලකා බැලීමේදී ද පළාත් අතර විෂමතාවයන් දැකිය හැකිය. 2010 - 2013 අතර, කාලය තුල සබරගමුව, උතුර හා මධ්‍යම යන පළාත්වල ජාතික අගය වන 4.4 ට වඩා ඉහළ අනුපාතයක් නිරීක්ෂණය කළ හැක. විරැකියා අනුපාතයේ ඉහළම අගය වන 5.8 සබරගමුව පළාතෙහි දක්නට ලැබෙන අතර, පහළම අගය වන 3.2 ඌව පළාතෙන් වාර්තා වේ.

2009 වසරේ මාතෘ මරණ අනුපාතය සහ ළදරු මරණ අනුපාතය සලකා බලන විට තියුණු ප්‍රාදේශීය විෂමතාවක් දක්නට ලැබේ. මාතෘ මරණ අනුපාතයේ ඉහළම අගය 16.8 ක් ලෙස වයඹ පළාතෙන් වාර්තා වන අතර, ළදරු මරණ අනුපාතයේ ඉහළම අගය 16.2 ක් ලෙස උතුරු පළාතෙන් වාර්තා වේ.

ජාතික මට්ටමින් ගත් විට විදුලි බලය සහිත ගෘහ ඒකක සංඛ්‍යාවේ ද සැලකිය යුතු වැඩි වීමක් දක්නට ලැබේ. 2006 වර්ෂයේ දී එම ගෘහ ඒකක ප්‍රමාණය මුළු ගෘහ ඒකක සංඛ්‍යාවෙන් 80% ක් වූ අතර, 2010 වර්ෂය වන විට එම ප්‍රතිශතය 85.3% දක්වා වැඩි වී ඇත. විදුලි බලය සහිත අවම ගෘහ ඒකක සංඛ්‍යාව 69.6% ක් ලෙස උතුරු පළාතෙන් වාර්තා වන අතර, 95% ක් වන වැඩිම ප්‍රතිශතයට හිමිකම් කියන්නේ බස්නාහිර පළාතය. පොදුවේ ගත් කළ සෑම පළාතකම මෙම ප්‍රතිශතයේ වර්ධනයක් දක්නට ඇත.

2009 / 2010 කාලය තුළ ආරක්ෂිත පානීය ජල පහසුකම් සහිත වැඩිම ගෘහ ඒකක ප්‍රතිශතය උතුරු පළාත තුළ දක්නට ලැබෙන අතර, එය 96.2% කි. ආරක්ෂිත පානීය ජල පහසුකම් සහිත අවම ගෘහ ඒකක ප්‍රතිශතයක් ඌව පළාතේ දැකිය හැකි වන අතර, එය 69.9% කි.

2012 වර්ෂයේ දී, ජාතික මට්ටමේ පරිගණක සාක්ෂරතා ප්‍රතිශතය 24.2% කි. කෙසේවුවද, 32.9% ක ඉහළම ප්‍රතිශතය බස්නාහිර පළාත තුළ දක්නට ලැබෙන අතර, 17.6% ක අවම ප්‍රතිශතය ඌව පළාත තුළ දක්නට ලැබේ. 2013 වසරේ ශ්‍රී ලංකාවේ උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන් අතරින් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබුවේ 58.6 ක ප්‍රතිශතයකි. පළාත් අතර සංසන්දනයේ දී, එහි සැලකිය යුතු ප්‍රාදේශීය විෂමතා වාර්තා වේ. උතුරු පළාත 63.9 ක ඉහළම ශිෂ්‍ය ප්‍රතිශතයක් පෙන්වනු ලබන අතර, අවම වූ 56 ක ප්‍රතිශතය, ඌව පළාතෙන් වාර්තා වේ.

ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය මැනීමෙහි ලා සෞභාග්‍යතා දර්ශකය සුලභව භාවිතා කරනු ලබන මිනුම් දණ්ඩකි. ආර්ථික හා ව්‍යාපාරික වාතාවරණය, සමාජ ආර්ථික යටිතල පහසුකම් හා සමාජයීය සුභසාධනය යන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ විචල්‍යයන් 26 ක් භාවිතා කරමින් මෙම දර්ශකය සකස් කරනු ඇත. 2009 සිට 2012 දක්වා කාලය තුළ මෙම දර්ශකයට අදාලව පළාත් සැසඳීමේ දී විෂමතාවන් දැකිය හැකි වුවද, පොදුවේ ගත් කළ එහි ඉහළ යාමක් දක්නට ලැබේ. දර්ශකයේ ඉහළම අගය වන 73.5 බස්නාහිර පළාතෙන් ද 51.8 වූ අවම අගය උතුරු පළාතෙන්ද දැකිය හැක. ජාතික අගය හා සැසඳීමේ දී බස්නාහිර පළාත හැර අනෙකුත් සියලුම පළාත් මෙම දර්ශකය විෂයෙහි සාපේක්ෂව අඩු අගයක් පෙන්වනු ලබයි.

### 6.2 ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා යෝජිත ක්‍රියාමාර්ග

අතීතයේ දී යම් යම් ප්‍රතිකර්ම ගනු ලැබුයේ වුවද, රට තුළ තවමත් ප්‍රාදේශීය විෂමතා දක්නට ලැබේ. සමාජ-ආර්ථික දර්ශක අනුව ගත් විට (විශේෂයෙන් සහස්‍ර සංවර්ධන ඉලක්ක) සාර්ව මට්ටමෙන් මනා කාර්ය සාධනයක් පැවතිය ද, තවමත් බොහෝ පළාත් සංවර්ධනය අතින් පසුගාමී තත්ත්වයක පවතී. මූලික යටිතල පහසුකම්, විශේෂයෙන් මාර්ග පහසුකම් නොමැතිවීම හේතුකොටගෙන භූගෝලීය වශයෙන් හුදෙකලා වූ ප්‍රදේශ බොහොමයක් දක්නට ලැබෙන බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. මේ තත්ත්වය නිසා මෙම ප්‍රදේශවලට වෙළඳපොළට ප්‍රවිශ්‍ය වීමේ අවස්ථා සීමා වී ඇත.

ප්‍රාදේශීය සංවර්ධනය හා සම්බන්ධ මෙම අහිතකර තත්ත්වයන් පිටුදැකීම සඳහා පළාත් සංවර්ධන ක්‍රියාවලියේ දී, පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවට නිර්දේශ කෙරේ.

i. තම පළාත්වල සැලසුම් කරන ලද සංවර්ධන කාර්යයන් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැති බවට පළාත් අධිකාරීන් විසින් තර්ක කරනු ලැබේ. මෙයට හේතුව ලෙස පෙන්වා දෙනු ලබන්නේ පළාත් සභා ක්‍රමයට පරිබාහිරව ගොස් ජාතික මට්ටමේ ආයතන විසින් ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කිරීමයි. මේ තත්ත්වය තුළ, පළාත් තුළට සිදු කෙරෙන සියලුම අරමුදල් ප්‍රවාහයන් පවත්නා ව්‍යවස්ථාමය ක්‍රමවේදය තුළ සිදු කළ යුතු වේ. තවද, මධ්‍යකාලීන ප්‍රතිඵල රාමුව මත පදනම්ව පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ඒකාබද්ධ සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වීම තහවුරු කරනු වස්, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

ii. රාජ්‍ය සම්පත් සීමාසහිත බැවින්, පළාත් මට්ටමෙන් සිදු කරනු ලබන සියලුම සංවර්ධන කාර්යයන් රජයේ අරමුදල් මගින් පමණක් සිදු කළ නොහැකි බව තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ විකල්ප අරමුදල්, විශේෂයෙන් පෞද්ගලික අංශයේ සහය ලබාගැනීමට ඇති හැකියාව ගැන උනන්දු වීම ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම ඌණ සංවර්ධිත ප්‍රදේශවලට අරමුදල් සැපයීම මෙහිදී වැඩි අවධානයට ලක් විය යුතු කරුණකි. මේ අනුව, පෞද්ගලික අංශයේ සහභාගිත්වය උනන්දු කරවීමේ අරමුණින් වරණාත්මක බදු සහ සහනදායී පොලී අනුපාත වැනි රාජ්‍ය මූල්‍ය සානුබලයන් දැනට පවත්නා උපාය මාර්ගයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස හඳුනාගත යුතු වේ.

iii. පවත්නා නීතිමය විධිවිධාන වලට අනුව, ආදායම් පදනම වැඩිදියුණු කිරීමේ හැකියාවන් පැවතිය ද, පළාත් සභා ඇතුළු උප ජාතික මට්ටමේ සෑම ආයතනයක්ම පාහේ රාජ්‍ය අරමුදල් කෙරෙහි දැඩි ලෙස රඳා පැවතීම ඉතා පැහැදිලි කරුණකි. මෙම තත්ත්වය තුළ පළාත් සභා හා පළාත් පාලන ආයතන වැනි උප ජාතික මට්ටමේ ආයතන විසින් නීතිමය වශයෙන් තමන්ට පැවරී ඇති ආදායම් මූලාශ්‍ර හරහා අතිරේක සම්පත් උපයා ගැනීම පිණිස නව ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු වේ. මෙලෙස උපයාගත් ආදායම් මුළුමනින්ම පාහේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය කරනු වෙනුවට, එයින් සාධාරණ කොටසක් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතු වේ.

iv. කුඩා පරිමාණ ව්‍යාපෘති හා වැඩසටහන්වල ආයෝජනය කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන තත්ත්වයක් තුළ මේ පිළිබඳ නව කෝණයකින් බැලීම සඳහා පළාත් අධිකාරීන් වෙත කාලය එළඹ ඇත. එබැවින්, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට තුඩු දෙන ප්‍රතිඵල ජනිත කළ හැකි කැපී පෙනෙන ව්‍යාපෘති (Flagship Projects) කිහිපයකට ප්‍රමුඛතාවය ලබාදෙන පරිදි පළාත් අධිකාරීන් විසින් ස්වකීය සංවර්ධන සැලසුම් යළි විමර්ශනය කළ යුතු බවට නිර්දේශ කෙරේ.

v. පළාත් අධිකාරීන් විසින් ප්‍රාග්ධන වෙළඳපොළේ දැනට තිබෙන නවීන ණය උපකරණ භාවිතයට ගෙන අතිරේක සම්පත් සොයා ගැනීම කෙරෙහි ස්වකීය අවධානය ප්‍රධාන වශයෙන් යොමු කළ යුතුව ඇත. ලාභදායී ආයෝජන අවස්ථාවල අතිරේක අරමුදල් යෙදවීමේ මාධ්‍යයක් ලෙස ස්වකීය ආයතනවල සමායතන සංස්කෘතියක් (Corporate Culture) වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පවතී. රාජ්‍ය සේවකයින් ලාභදායී ව්‍යවසායන් පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා නොගැලපෙන හෙයින්, මූල්‍යමය හා ශක්‍යතාවකින් යුතු ව්‍යාපෘති සඳහා රාජ්‍ය අරමුදල් යෙදවීම සිදු නොකළ යුතුව ඇත.

vi. දැනට භාවිතයේ පවත්නා නිමැවුම් පාදක කොටගත් සාම්ප්‍රදායික ගිණුම් ක්‍රම වෙනුවට, පළාත් මට්ටමේ දී වඩා ඵලදායී මූල්‍ය කළමනාකරණ ක්‍රම හඳුන්වා දීම ඉතා වැදගත් වේ. ප්‍රතිඵල පාදක ප්‍රවේශය පදනම් කරගත් අයවැයකරණය හා නව ගිණුම් ක්‍රම පළාත් ආයතන තුළට හඳුන්වාදීම තුළින් වගවීම, මුදලෙහි වටිනාකම හා යහපාලනය වැනි මූලධර්ම මත යහපත් බලපෑමක් සිදුවෙනු ඇත.

## 7. සමාප්තිය

වර්තමාන රජය විසින් බලය බෙදාහැරීම සංවර්ධන ප්‍රතිපත්තියෙහි වැදගත් අංශයක් ලෙස හඳුනාගෙන ඇත. රජය විසින් මෑතකදී ගනු ලැබූ ඇතැම් පරිපාලනමය ක්‍රියාමාර්ගවල දී, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් ජාතික හා පළාත් මට්ටමෙන් සාධනීය සම්බන්ධතාවයක් වර්ධනය කර ඇති බව නිරීක්ෂණය වේ. රජයේ ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් පළාත් අධිකාරීන් විසින් සංවර්ධන කටයුතු සිදු කරගෙන යන බව හා රජය විසින් අනුමත කරන ලද යහපාලන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමෙහිලා ඔවුන් දායකත්වය සපයන බව පැහැදිලි දක්නට ලැබේ.

ඉදිරියේ දී, පළාත්වලට ව්‍යවස්ථානුකූලව පවරන ලද කාර්යයනට අදාලව සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීමට අපේක්ෂා කෙරේ. ජාතික මට්ටමේ ආයතන විසින් උප ජාතික මට්ටමෙන් සෘජුවම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධෛර්යමත් කරනු ලබන අතර, පළාත් මට්ටමේ ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ඇත.

වඩා ඵලදායී ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීමෙහිලා අවශ්‍ය ඒකාබද්ධ ප්‍රවේශයක් ස්ථාපනය කිරීමේ අරමුණින් පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ආයතන අතර නිසි යාන්ත්‍රණයක් ඇති කරලීම ඉතා අවශ්‍ය වී ඇත. මහජනතාවට සාර්ථක ප්‍රතිඵල අත්කර දීමේ අරමුණ ඇතිව, පළාත් මට්ටමෙන් ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය මත පදනම් වූ ඒකාබද්ධ සංවර්ධන උපාය මාර්ගයක් සැකසීම අවශ්‍ය කෙරේ. මෙහිදී, දැනට ක්‍රියාත්මක වන පළාත් අධිකාරීන්, දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු වැනි විවිධ ආයතන හරහා එක්ව පළාතට අරමුදල් වෙන් කිරීමේ ක්‍රමවේදය සංශෝධනයකට ලක් කළ යුතු වේ.

රාජ්‍ය අරමුදල් මත දැඩි ලෙස රඳා පැවතීමේ ක්‍රමවේදයෙන් ඉවත් වී ප්‍රාදේශීය සංවර්ධනය සඳහා විකල්පීය නවෝත්පාදක මූල්‍යකරණ ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා මේ වන විට කාලය එළඹ ඇත. විශේෂයෙන් මෙහිලා සඳහන් කළ යුතු කරුණක් වනුයේ, අගනුවර හා ප්‍රධාන නගර කේන්ද්‍ර කරගත් ප්‍රදේශවලින් බාහිරව පිහිටි ප්‍රදේශ, විශේෂයෙන් සංවර්ධන මට්ටමෙන් අඩු ප්‍රදේශ කරා පෞද්ගලික ආයෝජකයින් ආකර්ශණය කරගැනීම සඳහා වූ යෝග්‍ය උපායමාර්ග හඳුනාගැනීමයි.

ආරියරත්න හේවගේ
පත් කළ සාමාජික හා සභාපති

ආර්.එච්.එස්.සමරතුංග
නිල බලයෙන් සාමාජික

අර්ජුන මහේන්ද්‍රන්
නිලබලයෙන් සාමාජික

එම්.එන්.ජුනයිඩ
පත් කළ සාමාජික

එස්. අමිර්තලිංගම්
පත් කළ සාමාජික

*ඇමුණුම - I*

## සාමූහික ප්‍රදාන වෙන් කිරීම හා බෙදා හැරීම 2009 – 2014

*(රු.මි.)*

| පළාත | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම 2014.10.31 දක්වා |
| බස්නාහිර | 1,923 | 2,749 | 6,100 | 6,100 | 7,170 | 8,979 | 9,011 | 8,894 | 8,502 | 9,691 | 11,234 | 8,869 |
| මධ්‍යම | 12,176 | 12,487 | 13,000 | 13,000 | 13,270 | 13,697 | 13,763 | 13,049 | 14,864 | 15,687 | 17,628 | 14,183 |
| දකුණු | 10,298 | 10,085 | 10,500 | 10,500 | 11,172 | 11,760 | 11,803 | 11,907 | 12,908 | 13,586 | 15,511 | 12,816 |
| උතුර | 8,349 | 7,963 | 8,400 | 8,700 | 9,153 | 9,318 | 8,557 | 8,500 | 10,075 | 10,795 | 12,552 | 10,244 |
| නැගෙනහිර | 9,891 | 9,421 | 10,100 | 10,100 | 10,473 | 10,952 | 11,385 | 10,737 | 11,635 | 12,066 | 13,595 | 10,945 |
| වයඹ | 12,294 | 11,868 | 12,300 | 12,299 | 12,656 | 13,018 | 12,651 | 11,921 | 14,118 | 14,846 | 16,413 | 13,394 |
| උතුරු මැද | 6,270 | 6,513 | 7,300 | 7,300 | 7,386 | 7,596 | 7,005 | 6,776 | 7,346 | 7,765 | 10,436 | 8,433 |
| ඌව | 7,907 | 7,807 | 8,300 | 8,300 | 8,897 | 8,948 | 9,459 | 9,032 | 10,263 | 10,758 | 12,312 | 9,979 |
| සබරගමුව | 8,893 | 8,493 | 9,000 | 9,000 | 9,823 | 10,335 | 11,243 | 10,737 | 13,088 | 13,606 | 14,606 | 12,068 |
| **එකතුව** | **77,999** | **77,386** | **85,000** | **85,299** | **90,000** | **94,602** | **94,877** | **91,552** | **102,800** | **108,801** | **124,287** | **100,931** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය*

*ඇමුණුම* - ***II***

## උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම හා බෙදා හැරීම 2009 – 2014

*(රු.මි.)*

| පළාත | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | බෙදා දීම | වෙන් කිරීම | බෙදා දීම | වෙන් කිරීම | බෙදා දීම | වෙන් කිරීම | බෙදා දීම | වෙන් කිරීම | බෙදා දීම | වෙන් කිරීම | බෙදා දීම 2014.10.31 දක්වා |
| බස්නාහිර | 510 | 375 | 450 | 383 | 400 | 660 | 427 | 180 | 370 | 370 | 925 | 293 |
| මධ්‍යම | 446 | 306 | 410 | 308 | 375 | 337 | 400 | 218 | 321 | 193 | 430 | 129 |
| දකුණු | 426 | 230 | 350 | 298 | 325 | 292 | 347 | 189 | 295 | 177 | 380 | 255 |
| උතුර | 332 | 241 | 300 | 255 | 275 | 247 | 294 | 161 | 195 | 195 | 280 | 280 |
| නැගෙනහිර | 382 | 197 | 325 | 276 | 250 | 230 | 267 | 146 | 217 | 130 | 340 | 227 |
| වයඹ | 370 | 272 | 300 | 255 | 300 | 270 | 320 | 175 | 270 | 162 | 505 | 290 |
| උතුරු මැද | 297 | 137 | 260 | 260 | 275 | 1,277 | *1,616.63 | 1,420 | *1,005 | 742 | 350 | 193 |
| ඌව | 373 | 206 | 300 | 255 | 300 | 240 | 320 | 175 | 240 | 144 | 330 | 179 |
| සබරගමුව | 416 | 311 | 380 | 323 | 335 | 301 | 357 | 195 | 252 | 157 | 335 | 324 |
| **එකතුව** | **3,550** | **2,276** | **3,075** | **2,612** | **2,835** | **3,855** | **4,349** | **2,859** | **3,165** | **2,270** | **3,875** | **2,169** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය*
**අමතර වෙන් කිරීම් සමග*

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීම හා බෙදා හැරීම 2009 – 2014**

*(රු.මි.)*

| පළාත | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම් | වෙන් කිරීම | බෙදා දීම 2014.10.31 දක්වා |
| බස්නාහිර | 1,726 | 1,567 | 1,755 | 1,737 | 1,736 | 1,380 | 1,990 | 491 | 1,266 | 990 | 1,270 | 508 |
| මධ්‍යම | 2,572 | 1,606 | 2,145 | 1,895 | 2,490 | 1,369 | 3,013 | 857 | 1,229 | 738 | 1,230 | 742 |
| දකුණු | 1,727 | 1,102 | 1,773 | 1,656 | 1,535 | 1,283 | 1,818 | 814 | 1,229 | 737 | 1,230 | 820 |
| උතුර | 1,877 | 1,946 | 2,807 | 2,365 | 3,068 | 1,306 | 3,568 | 947 | 1,030 | 618 | 1,035 | 908 |
| නැගෙනහිර | 4,702 | 1,202 | 3,273 | 1,730 | 5,079 | 1,135 | 3,917 | 1,108 | 1,000 | 600 | 1,000 | 600 |
| වයඹ | 1,530 | 1,056 | 1,633 | 1,613 | 1,542 | 1,265 | 1,836 | 817 | 1,137 | 712 | 2,523 | 1,384 |
| උතුරු මැද | 1,701 | 1,202 | 2,350 | 1,956 | 2,808 | 1,141 | 2,807 | 718 | 1,000 | 600 | 1,000 | 550 |
| ඌව | 2,338 | 1,173 | 2,007 | 1,888 | 3,169 | 1,210 | 3,117 | 806 | 1,144 | 746 | 1,892 | 1,513 |
| සබරගමුව | 2,259 | 1,143 | 1,737 | 1,564 | 2,028 | 1,110 | 2,648 | 710 | 1,145 | 687 | 1,150 | 885 |
| එකතුව | **20,431** | **11,998** | **19,480** | **16,403** | **23,455** | **11,199** | **24,714** | **7,267** | **10,180** | **6,428** | **12,331** | **7,910** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය*
*සටහන: සංවර්ධන ව්‍යාපෘති ද ඇතුළත්ව*